සිවිල් සමාජ සෙවණැලි වාර්තාව

2026 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ඇගයීම වෙනුවෙන් මුල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) වෙත ඉදිරිපත් කිරීම



මූල්‍ය විශ්වාසනීයත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා වූ සිවිල් සමාජය

ශ්‍රී ලංකා සිවිල් සමාජ FATF ජාලය (Sri Lanka CSO FATF Network)

csoslfatfnetwork@gmail.com

2026 අගෝස්තු

සිවිල් සමාජ සෙවණැලි වාර්තාව

2026 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ඇගයීම වෙනුවෙන්

මුල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය (FATF) වෙත ඉදිරිපත් කිරීම

1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාව තුළ ලාභ නොලබන සංවිධාන (Non-Profit Organisations – NPOs) විසින් සිදුකරන ක්‍රියාකාරකම් මර්දනය කිරීමට සහ සිවිල් අවකාශය (civic space) සීමා කිරීමට, නීති, පරිපාලන නියෝග සහ භාවිතයන් හරහා FATF ප්‍රමිතීන් අනිසි ලෙස භාවිත කරනු ලබයි. මෙම ක්‍රියාමාර්ග FATF අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය බව රජය විසින් සාධාරණීකරණය කර ඇති අතර, මෙම වසරේ සිදුකෙරෙන ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය ඇගයීම දක්වමින් ඒවා සම්මත කිරීම සහ ක්‍රියාත්මක කිරීම වේගවත් කර ඇත.

එවැනි මෑතකාලීන ක්‍රියාමාර්ග අතරින් ප්‍රධානතම එකක් වන්නේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ යෝජිත නීතියේ කෙටුම්පත වන අතර, එමඟින් අධිකරණ අධීක්ෂණයකින් තොරව පොලිසියට සහ අනෙකුත් පරිපාලන ආයතනවලට පුළුල් හා අත්තනෝමතික බලතල ලබා දෙයි. එවැනි බලතල අතර අධිකරණ නියෝගයකින් තොරව පරිශ්‍රයකට ඇතුළු වී ලේඛන පරීක්ෂා කිරීම සහ ලියාපදිංචිය අත්හිටුවීමේ බලය ද ඇතුළත් වේ. යෝජිත නීතිය මඟින් පුළුල් පරාසයක් තුළ විහිදෙන සංවිධාන සහ ආයතන මධ්‍යම අධිකාරියක් යටතේ ලියාපදිංචි වී නිසි බලධාරියෙකුගේ (Competent Authority) අධීක්ෂණයට යටත් වීම අනිවාර්ය කරයි. එම ආයතන අතර ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, භාර (trusts), ඇපකරයෙන් සීමිත සමාගම් (companies limited by guarantee), සංගම්, සභා, ප්‍රජා නේවාසිකාගාර, පදනම්, සමාජ ව්‍යාපාර, අන්තර්-රාජ්‍ය ගිවිසුමක් මඟින් පිහිටුවා නොමැති ජාත්‍යන්තර සංවිධාන සහ සාමාන්‍ය ජනතාවගේ යහපත සඳහා ස්වේච්ඡා සමාජ සේවාවක් හෝ ලාභ නොලබන ක්‍රියාකාරකමක් සිදු කිරීම සඳහා පුද්ගලයන් පස් දෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් විසින් පිහිටුවන ලද කණ්ඩායම් ද ඇතුළත් වේ.

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත (Financial Transactions Reporting Act – FTRA), මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (Prevention of Money Laundering Act – PMLA) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සම්මුති පනත (Convention on Suppression of Terrorist Financing Act – CSTFA) වෙත මෑතකදී සිදුකරන ලද සංශෝධන මඟින් තීරණ ගැනීමේ බලය රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකු අත කේන්ද්‍රණය කර ඇති අතර, ලාභ නොලබන සංවිධාන වලට දණ්ඩනීය පරිපාලන ක්‍රියාමාර්ග පැනවීමට ඔවුන්ට බලය ලබා දී ඇත. බරපතළ සම්බාධක පැනවීමේදී මෙම සංශෝධන මඟින් සීමිත සාධාරණ ක්‍රියාපටිපාටි ආරක්ෂණ (due process safeguards) සහ අභියාචනා ක්‍රමවේද පමණක් සපයන අතර, නියාමන සහ විමර්ශන බලධාරීන්ට අසීමාන්තික බලතල ක්‍රියාත්මක කිරීමට ද ඉඩ සලසයි. එමෙන්ම, ඔවුන් වෙත අධිකරණමය කාර්යයන් ද පවරා ඇත.

2019 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පරිපාලන උපදෙස් මඟින් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති, විදේශ අරමුදල් ලබාගන්නා සෑම ලාභ නොලබන සංවිධානයක් සම්බන්ධයෙන්ම බැංකු විසින් වැඩිදියුණු කළ පාරිභෝගික නිසි පරීක්ෂාව (enhanced due diligence) සිදු කළ යුතු බව නියම කරයි. මෙය බොහෝ අවස්ථාවලදී බැංකු විසින් වැඩිදියුණු කළ නිසි පරීක්ෂාව සිදු කිරීම වෙනුවට, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති නම් එම ලාභ නොලබන සංවිධාන වෙත අරමුදල් බැර කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වී ඇත. එවැනි අවස්ථාවලදී, සාධාරණ සැකයක් නොමැතිව පවා ඔවුන් විසින් එම ලාභ නොලබන සංවිධාන පිළිබඳව ත්‍රස්තවාදී විමර්ශන අංශයට (Terrorism Investigation Division – TID) වාර්තා කිරීම ද සිදුකරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කාර්ය මණ්ඩලය ප්‍රශ්න කිරීම සඳහා කැඳවීම, ආරක්ෂක ආයතන විසින් නිරීක්ෂණයට ලක් කිරීම සහ හිරිහැර කිරීම සිදුවේ.

2025 දී ලාභ නොලබන සංවිධාන 100කට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ කරගනිමින් සිදුකළ සමීක්ෂණයකින් හෙළි වූයේ ලාභ නොලබන සංවිධාන වලට මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේදී දැඩි දුෂ්කරතා පවතින බවත්, එමඟින් මූල්‍යමය බැහැරකිරීම (financial exclusion) සහ අවදානම හේතුවෙන් සේවා ප්‍රතික්ෂේප කිරීම (de-risking) සිදුවන බවත්ය.

මේවා අනපේක්ෂිත ප්‍රතිවිපාක නොවේ. රාජ්‍යයේ ව්‍යවස්ථාදායක ප්‍රතිපත්තිය, එහි ප්‍රසිද්ධ ප්‍රකාශ සහ ලාභ නොලබන සංවිධාන සමඟ පැවති උපදේශනවලදී සිදුකරන ලද අදහස් දැක්වීම් එක්ව සලකා බැලීමේදී, ලාභ නොලබන සංවිධාන සඳහා සීමාකාරී, දැඩි ලෙස නිරීක්ෂණයට ලක්වන සහ ආරක්ෂක ක්‍රමවේද තුළින් පාලනය කරන පරිසරයක් නිර්මාණය කිරීමට හිතාමතාම උත්සාහයක් දරන බව පෙනී යයි. එවැනි පරිසරයක සුළු ගනුදෙනුවක්, විදේශීය ආධාරකරුවෙකු හා සම්බන්ධ වීමක් හෝ කිසියම් මානව හිමිකම් සම්බන්ධ ව්‍යාපෘතියක් පවා ත්‍රස්තවාදයට මුදල් සැපයීමට සම්බන්ධ බවට කිසිදු සාධාරණ සැකයක් නොමැතිව පරීක්ෂාවකට හෝ වාර්තා කිරීමට හේතුවක් විය හැකිය.

2. හැඳින්වීම

2.1. වාර්තාවේ අරමුණ සහ විෂය පථය

මෙම වාර්තාවේ අරමුණ වන්නේ, ප්‍රකාශනයේ නිදහස සහ සමාගමයේ (සංවිධානය වීමේ) නිදහස යන අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, FATF ප්‍රමිතීන් රාජ්‍යය විසින් අවියක් ලෙස භාවිත කර ඇති ආකාරය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීමයි.

මෙම වාර්තාව සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා සිවිල් සමාජ FATF ජාලය විසිනි. එය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පුද්ගලයන් සහ සංවිධානවල එකතුවක් වන අතර, මුදල් විශුද්ධිකරණයට (Anti-Money Laundering – AML) සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට (Countering the Financing of Terrorism – CFT) එරෙහි රජයේ ක්‍රියාමාර්ග මගින් සිවිල් සමාජයට ඇති කරන බලපෑම ලේඛනගත කරමින්, FATF ප්‍රමිතීන්ට අනුකූල වීම වෙනුවෙන් පෙනී සිටී.

3. ක්‍රමවේදය

මෙම වාර්තාව මඟින් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව (AML/CFT) රජයේ ක්‍රියාමාර්ග නිසා සිවිල් සමාජයට වන බලපෑම ඇගයීම සඳහා ප්‍රවේශයන් කිහිපයක් භාවිත කර ඇත.

3.1. අදාළ ජාතික මට්ටමේ නීති සහ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම

ජාතික මට්ටමේ නීති සහ ප්‍රතිපත්ති රාමුව මෙන්ම මහ බැංකුව සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද අදාළ චක්‍රලේඛ සමාලෝචනය කරන ලදී. මෙම විශ්ලේෂණය FATF නිර්දේශ, විශේෂයෙන් නිර්දේශ අංක 8 (Recommendation 8) සහ එහි අර්ථ නිරූපණ සටහන් (Interpretive Notes) මෙන්ම ලාභ නොලබන සංවිධාන අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම පිළිබඳ FATF නිර්දේශ කරන යහපත් භාවිතයන් (FATF Best Practices on Combating the Abuse of Non-profit Organisations) යන රාමුව තුළ සිදු කරන ලදී.

3.2. බැංකු සේවා සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ සමීක්ෂණය

රජයේ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ප්‍රතිපත්තිවල බලපෑම අවබෝධ කර ගැනීම සහ ලාභ නොලබන සංවිධාන වල මූල්‍ය සේවා වෙත ප්‍රවේශය පිළිබඳ අත්දැකීම් මත පදනම් වූ සාක්ෂි ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන 100ක් සම්බන්ධ කර ගනිමින් ප්‍රමාණාත්මක සමීක්ෂණයක් සිදු කරන ලදී. මානව හිමිකම් සංවිධාන සහ ප්‍රජා මට්ටමේ සංවිධාන ඇතුළු විවිධ සිවිල් සංවිධාන නියෝජනය වන පරිදි නියැදිය තෝරා ගන්නා ලදී.

3.3. ගුණාත්මක සාකච්ඡා

ශ්‍රී ලංකාව පුරා විසිර ඇති සිවිල් සංවිධාන සිවිල් සංවිධාන සහ ප්‍රජා මට්ටමේ සංවිධාන සමඟ සම්මුඛ සාකච්ඡා සහ කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡා මඟින් සමීක්ෂණයේ ප්‍රතිඵල තවදුරටත් පුළුල් සහ තහවුරු කළ අතර, නීත්‍යානුකූල සිවිල් සමාජ ක්‍රියාකාරකම් අධික ලෙස නියාමනය කිරීම සහ අවේක්ෂණයට ලක් කිරීම තුළින් ඔවුන් අත්විඳින සැබෑ අත්දැකීම් මෙන්ම එවැනි තත්ත්වයන් සමඟ කටයුතු කිරීමට ඔවුන් භාවිත කරන ක්‍රමවේද ද ලේඛනගත කරන ලදී.

3.4. සීමාවන්

මෙම වාර්තාවේ සීමාවන් අතරට පහත කරුණු ඇතුළත් වේ:

- **ප්‍රතිවිපාකවලට ඇති බිය: සිවිල් සංවිධාන ආරක්ෂක අංශ විසින් අවේක්ෂණයට ලක් කිරීම, පසු විපරම් කිරීම සහ හිරිහැර කිරීම හේතුවෙන්, ප්‍රතිවිපාකවලට බියෙන් ලාභ නොලබන සංවිධාන බොහෝමයක් අදහස් ප්‍රකාශ කිරීමට මැළිකමක් දැක්වූහ. මෙය ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වීම සීමා කිරීමට හේතු වී තිබිය හැක.**
- **මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ප්‍රතිපත්ති හේතුවෙන් ඇතිවන ගැටලු, එනම් බැංකු සම්බන්ධ ගැටලු හෝ බුද්ධි අංශ මඟින් සිදුකරන හිරිහැර වැනි කරුණු වාර්තා කිරීමට සිවිල් සංවිධාන වලට යා හැකි ස්වාධීන පැමිණිලි යාන්ත්‍රණ නොමැත. එබැවින් විශ්ලේෂණය, සමාලෝචනය සහ පසු විපරම සිදු කළ හැකි නිල පැමිණිලි/සිද්ධි ලේඛන හෝ සංඛ්‍යාලේඛන නොමැත. එම නිසා මෙම වාර්තාවේ සොයාගැනීම් එවැනි සිද්ධීන් පිළිබඳ පවතින එකම ලේඛනගත කිරීම වන අතර, සැබෑ තත්ත්වය අවම වශයෙන් පෙන්වන ඇස්තමේන්තුවක් විය හැකිය.**
- **දුරස්ථ ප්‍රදේශවල සහ ප්‍රජා මට්ටමේ සංවිධාන වෙත ළඟාවීමේදී සැලකිය යුතු අභියෝග පැවතිණි. මාර්ගගත සමීක්ෂණ මෙවලම් මත රඳා පැවතීම හේතුවෙන් එවැනි මෙවලම් භාවිත කිරීමට හැකියාව සහ ප්‍රවේශය ඇති සංවිධාන වලට සමීක්ෂණය වැඩි වශයෙන් යොමු වීමේ ස්වභාවික පක්ෂපාතීත්වයක් ඇති වූ අතර, එවැනි හැකියාවක් නොමැති සංවිධාන ඉන් බැහැර වීමට ඉඩ තිබිණි.**

4. සන්දර්භය

4.1. යුද්ධයෙන් පසු සහ පාස්කු ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය ආරක්ෂක ක්‍රියාමාර්ගවලට යටත් කිරීම

අනුක්‍රමිකව බලයට පත් වූ ශ්‍රී ලංකා රජයන් විසින් සිවිල් සංවිධාන කෙරෙහි සැක සහිත ආකල්පයක් අනුගමනය කර ඇති අතර, විදේශ අරමුදල් ලබා ගන්නා සිවිල් සංවිධාන කෙරෙහි වැඩි පාලනයක් සහ අධීක්ෂණයක් අවශ්‍ය බවට රාජ්‍යයේ ප්‍රධාන නිලධාරීන් සහ රජයේ සාමාජිකයන් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත.[1] සිවිල් සංවිධාන ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙසද අර්ථ නිරූපණය කර ඇති අතර, විදේශ අරමුදල් මගින් දේශීය සිවිල් සංවිධාන වෙත මුදල් ලබා දී ජනවාර්ගික හා ආගමික සුළුතරයන් "රැඩිකල්කරණයට" ලක් කිරීම, දේශීය අධ්‍යාපනයට මැදිහත් වීම[2] සහ මානව හිමිකම් පිළිබඳ ගැටලු මතු කිරීම හරහා රජයේ "කීර්තිනාමය විනාශ කිරීම" සිදු කරන බවට චෝදනා එල්ල කර ඇත.[3] විශේෂයෙන්ම, යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල මානව හිමිකම් ආරක්ෂකයන් සහ බලහත්කාරයෙන් අතුරුදන් කළ පුද්ගලයන්ගේ පවුල් වැනි කණ්ඩායම්, මෙම අපකීර්තියට පත් කිරීමේ සහ බාධා කිරීමේ ප්‍රධාන ඉලක්ක බවට පත්ව ඇත. සන්නද්ධ ගැටුම් සමයේ ආරම්භ වූ මෙම දුෂ්ඨකරණ ප්‍රචාරණ ක්‍රියාමාර්ග යුද්ධයෙන් පසු කාලය තුළ තවදුරටත් තහවුරු වී ඇත. 2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් අනතුරුව සිවිල් සමාජ සංවිධානවල ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා විවිධ යාන්ත්‍රණ හඳුන්වා දෙන ලද අතර, එතැන් සිට එවැනි අවේක්ෂණ සහ අධීක්ෂණ කටයුතු සැලකිය යුතු ලෙස තීව්‍ර වී ඇත.[4]

2019 වසරේ පාස්කු ඉරිදා ප්‍රහාරවලින් අනතුරුව, මුස්ලිම් ප්‍රජාව, මුස්ලිම් ආගමික කණ්ඩායම් සහ පුණ්‍යායතන ද ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස සලකනු ලැබීය. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳ චෝදනා හේතුවෙන් කටාර් අරමුදල් සහිත පුණ්‍යායතනයක් (Qatar Charity) ද තහනම් කරන ලදී.[5] කෙසේ වෙතත්, පසුව ශ්‍රී ලංකාවේ ඉන්ධන අර්බුදය අතරතුර, එම කටාර් රාජ්‍යය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා යථා තත්ත්වයට පත් කිරීම සහ අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා එම සංවිධානයට එරෙහි චෝදනා ඉවත් කරන ලදී.[6]

2021 වසරේදී, එවකට රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙසේ ප්‍රකාශ කළේය: "වර්තමාන සන්දර්භය තුළ, මෑතකදී සිදු වූ පාස්කු ඉරිදා මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර හේතුවෙන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මහජන මතය සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති අතර, සාමාන්‍යයෙන් රට පුරා ඒ පිළිබඳ හිතකර නොවන ආකල්පයක් පවතී. ඊට අමතරව, අරමුදල් වැරදි ලෙස

---

[1] https://www.dailymirror.lk/print/breaking-news/NGOs-spend-billions-unchecked/108-294744
[2] https://adaderana.lk/news/59892?nid=59892
[3] https://timesofindia.indiatimes.com/world/south-asia/lankan-govt-not-to-succumb-to-pressures-from-ngos-president-gotabaya-rajapaksa/articleshow/72224484.cms
[4] https://adaderana.lk/news/23000?nid=23000&mode=beauti
[5] https://dohanews.co/crisis-hit-sri-lanka-scraps-ban-on-qatar-charity-as-it-scrambles-to-secure-fuel/
[6] https://island.lk/lanka-lifts-ban-on-qatar-charity-as-it-tries-to-secure-fuel-supply-from-doha/

කළමනාකරණය කිරීම, සෘජුව හෝ වක්‍රව ත්‍රස්තවාදයට සහ බෙදුම්වාදයට සහාය දැක්වීම, ජාතික ආරක්ෂාව සම්බන්ධ ගැටලු, ස්වෛරීත්වයට එල්ල වන තර්ජන මෙන්ම ආගමික හා සංස්කෘතික කරුණු වැනි සාධක රැසක් මෙම අහිතකර මහජන මතය ගොඩනැගීමට දායක වී ඇත."[7]

සිවිල් සංවිධාන සෘජුව හෝ වක්‍රව ත්‍රස්තවාදයට සහාය දක්වන බවට චෝදනා කිරීම ඇතුළු විවිධ චෝදනා මතු කරමින්, අනුක්‍රමිකව රජයන් විසින් සිවිල් සංවිධානවල ක්‍රියාකාරකම් පිළිබඳ නිරීක්ෂණය සහ අධීක්ෂණය වැඩි කිරීමේ අවශ්‍යතාව සාධාරණීකරණය කර ඇති අතර, විදේශ අරමුදල් ලබාගැනීමේ ඔවුන්ගේ හැකියාවට මැදිහත් වීමටද කටයුතු කර ඇත. විශේෂයෙන්ම රටේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල කටයුතු කරන සිවිල් සමාජ කණ්ඩායම්, ප්‍රජා සංවිධාන සහ ක්‍රියාකාරීන්, සන්නද්ධ ගැටුම අවසන් වූ දා සිට ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාසය (TID), පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) සහ යුද හමුදා බුද්ධි අංශය වැනි ආරක්ෂක අංශවල විවිධ ආයතන විසින් තීව්‍ර කළ අවේක්ෂණයට සහ දැඩි සෝදිසියට ලක්ව ඇත.[8,9]

2019 නොවැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ලෙස තේරී පත්වීමත් සමඟ සිවිල් සංවිධාන සම්බන්ධයෙන් ආරක්ෂකමය දෘෂ්ටිකෝණයකින් කටයුතු කිරීම තවදුරටත් තීව්‍ර විය.[10] විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වූ සංවිධාන සහ ක්‍රියාකාරීන්, ආරක්ෂක අංශ ඔවුන්ගේ කාර්යාලවලට මෙන්ම නිවෙස්වලටද පැමිණි බව වාර්තා කළහ. එහිදී සංවිධාන පිළිබඳ තොරතුරු, අරමුදල් මූලාශ්‍ර සහ ක්‍රියාකාරකම් මෙන්ම, කණ්ඩායම් සාමාජිකයන්ගේ සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ පුද්ගලික තොරතුරුද ඉල්ලා සිටි බව ඔවුහු වාර්තා කළහ.[11,12]

විදේශීය අරමුදල් ලබා ගන්නා බැවින්,[13] 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ) පනත (VSSO පනත) යටතේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු බව දන්වමින්, එම සංවිධාන වෙත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයෙන් නිරන්තරයෙන් ලිපි යොමු කරනු ලැබේ. මෙය සිදුවන්නේ, එම සංවිධාන දැනටමත් සමාගම් පනත වැනි වෙනත් නීති යටතේ ලාභ නොලබන, ඇපයෙන් සීමිත සමාගම් ලෙස ලියාපදිංචි වී ඇති පසුබිමක හා, ඒ අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණයටද යටත්ව සිටියදීය.

2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසු, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පැවති අතර, 2022 වසරේදී තාවකාලිකව විදේශ කටයුතු අමාත්‍යාංශය යටතට ගෙන ගියද, එය ප්‍රධාන වශයෙන්ම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පැවතිණි. මෙයින් පෙන්නුම් කරන්නේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධීක්ෂණය පවත්වාගෙනයාම මහජන ආරක්ෂාව සම්බන්ධ කරුණක් ලෙස සලකා ඇති බවත්, වරදක් නැති බව තහවුරු වන තෙක් රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස දකින බවත්ය.

2025 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් සමාලෝචනයට ලක් කෙරෙමින් තිබියදී, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කරන ලදී. කෙසේ වෙතත්, ලේකම් කාර්යාලය මහජන ආරක්ෂක අංශයෙන් ඉවත් කිරීම පමණක්, රාජ්‍ය නොවන සංවිධාන දෙස බලන ආරක්ෂකමය දෘෂ්ටිකෝණයේ වෙනසක් ඇති කිරීමට හෝ ප්‍රතිපත්ති හා භාවිතයන්හි සැලකිය යුතු වෙනසක් ඇති කිරීමට හේතු වී නොමැත.

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි පවතින සැකය සහ ඒවායේ ක්‍රියාකාරකම් පාලනය හා සීමා කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති විවිධ ක්‍රියාමාර්ග තිබියදීත්, මේ දක්වා කිසිදු රාජ්‍ය නොවන සංවිධානයකට ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් අපරාධ චෝදනා ඉදිරිපත් කර නොමැත. එසේ වුවද, රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආර්ථිකයට සහ රටේ සමස්ත මානව සංවර්ධනයට දායක වෙමින් සිටී. කෙසේ වෙතත්, FATF නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ නාමයෙන් රාජ්‍යය විසින් පනවා ඇති සීමා හේතුවෙන්, සමාජ සංවර්ධනය සඳහා ලාභ නොලබන සංවිධාන විසින් සිදුකරන දායකත්වය අහිතකර ලෙස බලපෑමට ලක්ව ඇති අතර, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතියට ද බාධා එල්ල වී ඇත. තවද, COVID-19 වසංගත සමයේදී රජය මහජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමට අරගල කරමින් සිටියදී, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ

---

[7] https://www.dailymirror.lk/hard-talk/Govt-to-introduce-fresh-legislations-to-supervise-NGOs-INGOs-Raja-Goonaratne/334-220774

[8] https://documents.un.org/doc/undoc/gen/g25/136/66/pdf/g2513666.pdf

[9] https://www.ohchr.org/en/documents/reports/ahrc6021-situation-human-rights-sri-lanka-comprehensive-report-united-nations

[10] https://colombogazette.com/2020/07/06/special-probe-to-commence-on-non-governmental-organisations

[11] https://monitor.civicus.org/explore/civic-freedom-violations-persist-sri-lanka-president-expands-his-powers/

[12] https://www.amnesty.org/en/documents/asa37/1678/2020/en/

[13] Interviews with CSOs;
https://www.ft.lk/opinion/Weaponisation-of-Financial-Action-Task-Force-and-impact-on-CSOs/14-773063

ජනරාල්වරයා සෞඛ්‍ය යටිතල පහසුකම් සඳහා සහාය ලබාදෙන ලෙස රාජ්‍ය නොවන සංවිධාන වෙතින් ඉල්ලා සිටියේය.[14]

2020 පෙබරවාරි මාසයේදී ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් නිකුත් කරන ලද "ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහාත්, ජාතීන් හා ආගම් අතර මිත්‍රත්වය ශක්තිමත් කිරීම මඟින් ත්‍රස්තවාදය සහ අන්තවාදය තුරන් කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ යෝජනා" නම් වාර්තාවේ, රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය සම්බන්ධයෙන් පහත නිර්දේශ ඉදිරිපත් කර තිබුණි:[15]

- **ශ්‍රී ලංකාවට රාජ්‍ය නොවන සංවිධාන වෙතින් ලැබෙන සියලුම අරමුදල් සහ ආධාර නියාමනය කිරීමට හැකි වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU), ජාතික බුද්ධි ප්‍රධානියා සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ඒකාබද්ධ කළ හැකි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.**
- **රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය යටතේ විදේශ දායකත්ව නියාමන පනතක් (Foreign Contribution Regulation Act) වැනි පනතක් ස්ථාපිත කර, ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ආධාර නිසි ලෙස විගණනය කිරීමට පියවර ගැනීම. එමෙන්ම, එම අරමුදල් සමාජයේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වල යහපත සඳහා භාවිත වන බව සහතික කිරීම.**

එම වාර්තාව තවදුරටත් සඳහන් කළේ,

> "විදේශීය අරමුදල් ලබන සංවිධාන විශාල සංඛ්‍යාවක් ලියාපදිංචි වී නොමැති තත්ත්වයක් තුළ, රට තුළ සංසරණය වන මුදල් නිසි ලෙස අධීක්ෂණයට ලක් නොවේ. විවිධ විදේශීය අරමුදල් මත පදනම්ව ක්‍රියාත්මක වන නමුත් නිසි ලෙස නියාමනය නොවන රාජ්‍ය නොවන සංවිධානවල බැංකු ගිණුම් හරහා මුදල් ලැබෙන බව ආරක්ෂක අංශ මෙන්ම ජනමාධ්‍ය මඟින්ද විවිධ අවස්ථාවලදී අනාවරණය කර ඇත. මේ පිළිබඳව වැඩිදුරටත් විමසා බැලීමේදී, මැදපෙරදිග රටවලින් පවා අරමුදල් ලබන සංවිධාන රාශියක් ප්‍රාදේශීය මට්ටමින් පවා ක්‍රියාත්මක වන බවත්, එකී අරමුදල්වල ප්‍රමාණය සහ ඒවා යොදවන අරමුණු විධිමත් අධීක්ෂණයකට ලක් නොවන බවත් පැහැදිලි වේ."

2022 අරගලය ද එවකට පැවති රජය විසින් මෙලෙසම වැරදි ලෙස අර්ථ නිරූපණය කරන ලදී. එහිදී, රාජ්‍ය නොවන සංවිධාන හරහා හුවමාරු වූ විදේශ අරමුදල් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ධුරයෙන් ඉවත් කිරීමට හේතු වූ බවට චෝදනා කරන ලදී.[16]

මෙවැනි කතිකාවල ප්‍රතිඵල ලෙස සිවිල් සංවිධාන කෙරෙහි දැඩි සැකයක් ඇති වී ඇති අතර, අපරාධ/ත්‍රස්තවාදී විමර්ශන අංශ සහ බුද්ධි සේවා විසින් සිදුකරන හිරිහැර හා බිය ගැන්වීම් හේතුවෙන් එම සැකය තවදුරටත් උග්‍ර වී තිබේ. එබැවින්, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ මුවාවෙන් රාජ්‍ය නොවන සංවිධාන අරමුදල් මූලාශ්‍ර නියාමනය කිරීමට FATF ප්‍රමිතීන් අවියක් ලෙස භාවිත කිරීම, මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගවීම සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ඉල්ලා සිටින සිවිල් සමාජයේ ඉල්ලීම් නොසලකා හැරීම සඳහා අනුප්‍රාප්තික රජයන් විසින් දිගු කලක් තිස්සේ ගෙන යන ව්‍යාපාරයක කොටසක් ලෙස සැලකිය යුතුය.[17]

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ත්‍රස්තවාදයට මුදල් සැපයීම, මුදල් විශුද්ධිකරණය හෝ මහා පරිමාණ මූල්‍ය වංචා සම්බන්ධයෙන් නඩු පවරා හෝ වරදකරුවන් කර ඇති බවට මේ දක්වා ප්‍රසිද්ධියේ වාර්තා වූ කිසිදු සිද්ධියක් නොමැත. එසේ වුවද, ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය සම්බන්ධ මෑතකාලීන මහා පරිමාණ මූල්‍ය අපරාධ මඟින් මෙරට මූල්‍ය පද්ධතිය තුළ පවතින මූල්‍ය පාලන සහ මුදල් විශුද්ධිකරණ විරෝධී ක්‍රියාපටිපාටි වල සැලකිය යුතු දුර්වලතා අනාවරණය වී තිබේ.

2026 දී ජාතික සංවර්ධන බැංකුව (National Development Bank PLC - NDB) විසින් මුලිකව ඇස්තමේන්තු කරන ලද රුපියල් බිලියන 13.2ක පමණ අභ්‍යන්තර වංචාවක් අනාවරණය කරන ලද අතර, එය මෙරට ඉතිහාසයේ විශාලතම බැංකු වංචාවලින් එකක් බවට පත්ව ඇත.[18] තවත් සිද්ධියකදී, වාණිජ බැංකු 13කට අයත් බැංකු ගිණුම් 227ක් භාවිත

---

[14] https://www.sundaytimes.lk/210516/news/govt-seeks-funds-from-ingos-and-ngos-for-covid-battle-444172.html

[15] https://www.parliament.lk/uploads/comreports/1582610584075624.pdf#page=1

[16] https://hirunews.lk/en/446285/namal-rajapaksa-vows-probe-into-aragalaya-funding-under-future-government

[17] https://www.ft.lk/columns/Central-Bank-NGO-Secretariat-and-weaponisation-of-Financial-Action-Task-Force/4-770882; https://srilankabrief.org/repression-by-regulation-when-fatf-mutual-evaluations-become-government-weapons/

[18] https://cdn.cse.lk/cmt/announcement_portal_prod/Corporate%20Disclosure-%20National%20Development%20Bank%20PLC%2006.04.2026_49238571050043746.pdf

කරමින් ව්‍යාජ ආනයන ගනුදෙනු හරහා ඇමරිකානු ඩොලර් මිලියන 85ක් පමණ අයුතු ලෙස විදේශයන් වෙත මාරු කර ඇති බවට සැක කෙරෙන මහා පරිමාණ විදේශ විනිමය වංචාවක් ශ්‍රී ලංකා බලධාරීන් විසින් අනාවරණය කරන ලදී.[19] මෙම සිද්ධීන් මඟින් පෙන්නුම් කරන්නේ මූල්‍ය අපරාධ සහ මුදල් විශුද්ධිකරණ අවදානම් විධිමත් මූල්‍ය පද්ධති තුළ සංකේන්ද්‍රණය වී තිබුණද, සිවිල් සමාජය මත ක්‍රියාත්මක කරන අධික අධීක්ෂණය බැංකු ක්ෂේත්‍රය මත ක්‍රියාත්මක නොවන බවයි. එසේ වූයේ නම්, ඉහත සඳහන් ගනුදෙනු වල සෑම අදියරකදීම අවදානම් සංඥා (red flags) මතු කර තිබිය යුතුව ඇත.

5. FATF නිර්දේශ සමඟ ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව සමාලෝචනය කිරීම

2026 ජූලි මාසයේදී රජය දැනට පවතින නීති තුනක් සංශෝධනය කරන ලදි. එනම්: මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත (FTRA), ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සම්මුති පනත (CSTFA), මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (PMLA). මෙම සංශෝධන FATF ප්‍රමිතීන්ට අනුකූල කිරීම සහ අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීම අරමුණු කරගෙන සිදුකරන ලද බව වාර්තා විය. කෙසේ වෙතත්, මෙම සංශෝධන ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂණයන්ට අනුකූල නොවීය.

මෙම නීති එකිනෙක සමඟ ක්‍රියාත්මක වන විට, තීරණ ගැනීමේ බලය රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකු අත සංකේන්ද්‍රණය කරන අතර, සිවිල් සංවිධාන පරිපාලනමය දණ්ඩනීය ක්‍රියාමාර්ගවලට යටත් කිරීමට අවකාශයක් නිර්මාණය කරයි. බරපතළ සම්බාධක පැනවීමේදී මෙම සංශෝධන මඟින් සාධාරණ ක්‍රියාපටිපාටි ආරක්ෂණ (due process safeguards) සහ අභියාචනා ක්‍රියාවලීන් ඉතා සීමිත ප්‍රමාණයක් පමණක් සපයන අතර, නියාමන සහ විමර්ශන බලධාරීන්ට තිබිය යුතු සීමාව ඉක්මවා යන බලතල ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසයි. එමෙන්ම ඔවුන් වෙත අධිකරණමය කාර්යයන් ද පවරයි. මෙම කරුණු නිසා, මෙම සංශෝධන මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ක්‍රියාමාර්ග සඳහා සමානුපාතික සහ අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මෙන්ම මධ්‍යගත අධිකාරියකට වඩා අන්තර් ආයතනික සහයෝගීතාව අනුමත කරන FATF ප්‍රමිතීන් සමඟ නොගැළපේ.

5.1 නීති සංශෝධන

1. ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සම්මුති (සංශෝධන) පනත (CSTFA) 2026

CSTFA පනතෙහි සිදුකළ සංශෝධනයෙහි FATF ප්‍රමිතීන් සහ නිර්දේශ වලට පටහැනි විධිවිධාන අඩංගුය.

මුල් පනත යටතේ, පුද්ගලයෙකු ත්‍රස්තවාදය සම්බන්ධ වරදක් සිදුකිරීමට සම්බන්ධ විය හැකි බවට සාධාරණ පදනම් (reasonable grounds) ඇති විට පොලිස් නිලධාරියෙකුට එම පුද්ගලයාට අයත් අරමුදල් සහ දේපළ දින හතක කාලයක් සඳහා අත්හිටුවීමට බලය තිබුණි. සංශෝධනය මඟින් මෙම කාලය වැඩකරන දින දහහතරක් දක්වා දීර්ඝ කර ඇත. එනම්, මුල් කාලසීමාව මෙන් තෙගුණයකට ආසන්න කාලයක් සඳහා අධිකරණ අධීක්ෂණයකින් තොරව අරමුදල් අත්හිටුවිය හැකිය.

අධිකරණ අධීක්ෂණයකින් තොරව මෙවැනි කාලසීමාවක් දීර්ඝ කිරීම FATF විසින් නිර්දේශ කරන ආරක්ෂණ ක්‍රමවේද සහ සාධාරණ ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතාව සම්බන්ධයෙන් බරපතළ හිඩසක් පෙන්වයි. තවද, අත්හිටුවීමේ නියෝගය තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරියෙකුට මහාධිකරණයට ඒකපාක්ෂික (ex parte) අයදුම් කිරීමට ලබාදී ඇති කාලය ද වැඩකරන දින දහහතරක් දක්වා දීර්ඝ කර ඇත. මහාධිකරණය විසින් අත්හිටුවීමේ නියෝගය තහවුරු කිරීමට පෙර, එම නියෝගයට එරෙහිව අභියාචනය කිරීමට හෝ එය අභියෝග කිරීමට පනත මඟින් කිසිදු ක්‍රමවේදයක් සපයා නොමැත.

ඒකපාක්ෂික අයැදුම (Ex parte application) මඟින් තම අරමුදල් අත්හිටුවීමට යටත් කර ඇති පුද්ගලයාගේ සාධාරණ ක්‍රියාපටිපාටි අයිතිවාසිකම් දුර්වල කරයි. අධිකරණ අධීක්ෂණයකින් තොරව අරමුදල් අත්හිටුවීමේ නියෝග ක්‍රියාත්මක විය හැකි කාලය දීර්ඝ කිරීම මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල නොවන අතර, විශේෂයෙන්ම එමඟින් පුද්ගලයෙකුට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ප්‍රවේශය අහිමි වන්නේ නම්, එය අමානුෂික සැලකීමක් බවට පත්විය හැකිය.

[19] https://www.newswire.lk/2026/06/09/sri-lanka-uncovers-major-import-scam-that-smuggled-millions-of-dollars-out-of-the-country/

මෙම සංශෝධනයේ ව්‍යවස්ථානුකූලභාවය සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. 2026 අප්‍රේල් 28 දිනැති සිය තීරණයේදී, පවතින දින හතක කාලය වැඩකරන දින දහහතරක් දක්වා දීර්ඝ කිරීම ව්‍යවස්ථා විරෝධී නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය.[20] පනත් කෙටුම්පතේ කිසිදු විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ නොගැලපීමේ ගැටලුවක් නොමැති බව බවද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය.

2. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත (FTRA) 2026

FTRA පනතෙහි සිදුකළ සංශෝධනයෙහි විධිවිධාන කිහිපයක් FATF ප්‍රමිතීන් සමඟ පටහැනි වන අතර FATF විසින් අවශ්‍ය කර ඇති සීමාව ඉක්මවා යයි. උදාහරණයක් ලෙස, නීතිය මඟින් මූල්‍ය බුද්ධි ඒකකයේ (FIU) ප්‍රධානියාට පුළුල් නීති සම්පාදන බලතල ලබා දෙන අතර, පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව නීතිමය බලපෑමක් ඇති බැඳී පවතින උපදෙස්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ නිකුත් කිරීමට ඔහුට බලය ලබා දෙයි.

මෙය ලාභ නොලබන සංවිධාන සම්බන්ධයෙන් විශේෂයෙන් කනස්සල්ලට කරුණකි. මන්ද, පුළුල් හා නිර්වචනය නොකළ නියාමන අවශ්‍යතා, නීති සම්පාදනය හරහා නොව පරිපාලන ක්‍රියාමාර්ග මඟින් පැනවීම හරහා අත්තනෝමතික සහ මර්දනකාරී අනුකූලතා බැඳීම් ඇති විය හැකි බැවිනි.

මූල්‍ය බුද්ධි ඒකකයට පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක මූල්‍ය ගනුදෙනු අත්හිටුවිය හැකි කාලය දින හතක සිට වැඩකරන දින දහහතරක් දක්වා දීර්ඝ කර ඇති අතර, එය ඒකපාක්ෂික (ex parte) මහාධිකරණ ක්‍රියාපටිපාටි සහ විනිසුරු කුටිය තුළ රහසිගත (in-camera) විභාග සමඟ සම්බන්ධ වේ. මෙය සාධාරණ ක්‍රියාපටිපාටිය සහ විනිවිදභාවය සම්බන්ධයෙන් බරපතළ ගැටලු මතු කරන අතර, මූල්‍ය ගනුදෙනු සඳහා අත්තනෝමතික සීමා පැනවීමට අවකාශයක් නිර්මාණය කරයි. එවැනි සීමා පුද්ගලයන්ගේ ජීවනෝපාය සහ වාණිජ ක්‍රියාකාරකම්වලට අහිතකර ලෙස බලපෑ හැකිය.

සංශෝධනය මඟින් පැහැදිලි අපක්ෂපාතී නිර්ණායක, විනිවිදභාවය, ක්‍රියාපටිපාටි ආරක්ෂණ සහ ස්වාධීන අධිකරණ අධීක්ෂණයකින් තොර පරිපාලන යාන්ත්‍රණ හරහා දැඩි සම්බාධක සහ අනුකූලතා බැඳීම් පනවයි. මෙය අත්තනෝමතික සහ අසමාන ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති කරයි.

බැංකු විසින් තවමත් නිශ්චිත කර නොමැති සීමාවකට වඩා වැඩි සියලු ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම පනත මඟින් අනිවාර්ය කරයි. මෙය සාධාරණ සැකයක් මත පදනම් නොවන පොදු වාර්තා කිරීමේ බැඳීමක් (blanket reporting obligation) හඳුන්වා දෙන අතර, FATF හි අවදානම් මත පදනම් වූ සහ සමානුපාතික ප්‍රවේශයෙන් බැහැර වේ. එමෙන්ම මූල්‍ය ආයතන මත සැලකිය යුතු පරිපාලන බරක් පනවයි.

මූල්‍ය බුද්ධි ඒකකය සඳහා ජාත්‍යන්තර ආයතන ඇතුළු පුළුල් පරාසයක පාර්ශ්ව සමඟ තොරතුරු හුවමාරු කිරීමටද සංශෝධන මඟින් ඉඩ ලබා දී ඇත. එහෙත් දත්ත රඳවා තබා ගැනීම, වරප්‍රසාද ලත් තොරතුරු ආරක්ෂා කිරීම හෝ පුද්ගලික දත්ත මකා දැමීම සම්බන්ධ ප්‍රමාණවත් ආරක්ෂණ නොමැති බැවින්, සැලකිය යුතු පෞද්ගලිකත්ව සහ සයිබර් ආරක්ෂණ ගැටලු මතු වේ.

තවද, මහ බැංකු අධිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික කමිටුවට (National Committee) නියාමකයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත බැඳී පවතින උපදෙස් නිකුත් කිරීමට පුළුල් බලතල ලබා දී ඇත. එම බලතල අමාත්‍ය මණ්ඩලය දක්වා ඉහළ නැංවිය හැකි අතර, එමඟින් පවතින නීතිමය සහ ආයතනික වගවීමේ රාමු ප්‍රායෝගිකව අභිබවා යා හැකිය.

පනත සම්මත කිරීමට පෙර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සමඟ නොගැළපෙන බවට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝග කරන ලදී. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණය එම තර්කය පිළිගත්තේ නැත.[21] මූල්‍ය බුද්ධි ඒකක ප්‍රධානියාට රෙගුලාසි සකස් කිරීමේදී සහ දැඩි සම්බාධක පැනවීමේදී බලය සීමා කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ සංශෝධනයේ අඩංගු බව අධිකරණය තීරණය කළ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වීම සඳහා ඇතැම් වගන්තිවල වචනවල සුළු සංශෝධන පමණක් නිර්දේශ කළේය.

[20] https://supremecourt.lk/wp-content/uploads/special_dt/sc_sd_17_2026.pdf
[21] https://www.parliament.lk/uploads/bills/gbills/scdet/6423.pdf

3. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත 2026

මෙම සංශෝධනය මඟින් විමර්ශන සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත, විශේෂයෙන් අරමුදල් අත්හිටුවීම, රාජසන්තක කිරීම සහ විමර්ශන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්, පුළුල් සහ මාර්ගෝපදේශ රහිත අභිමත බලතල ලබා දෙයි. එහි ප්‍රමාණවත් ක්‍රියාපටිපාටි ආරක්ෂණ නොමැති අතර, පුළුල් අත්හිටුවීම් සහ රාජසන්තක කිරීමේ බලතල හරහා දේපළ අයිතිවාසිකම්, ජීවනෝපාය සහ නීත්‍යානුකූල මූල්‍ය ක්‍රියාකාරකම්වලට ආක්‍රමණශීලී ලෙස මැදිහත් වීමට ඉඩ සලසයි.

"විශේෂ විමර්ශන තාක්ෂණික ක්‍රම (special investigation techniques)", ව්‍යුත්පන්න දේපළ අත්හිටුවීම (derivative property freezing) සහ "නීති විරෝධී ක්‍රියාකාරකම් (unlawful activity)" යන සංකල්පවල පුළුල් පරාසයක් සහිත නිශ්චිත නොවන සහ අතිශය පුළුල් විධිවිධාන ද එහි අඩංගු වේ. බලගන්වන ලද දිවුරුම් ප්‍රකාශ (affidavits) සහ පරස්පර විරෝධී ප්‍රකාශ සම්බන්ධයෙන් දණ්ඩනීය ප්‍රතිවිපාක ඇති කිරීම හරහා, නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනය සහ තමන්ට එරෙහිව සාක්ෂි ලබාදීමට බල නොකිරීමේ ආරක්ෂණය දුර්වල කරන විමර්ශන යාන්ත්‍රණ මෙම නීතිය මඟින් නිර්මාණය කරයි.

විදේශීය ආයතන සමඟ පුළුල් පරාසයක මූල්‍ය හා පුද්ගලික තොරතුරු හුවමාරු කිරීමට ද සංශෝධනය මඟින් බලය ලබා දී ඇති නමුත්, එවැනි තොරතුරු හුවමාරුවේ අවශ්‍යතාව, සමානුපාතිකභාවය, වගවීම සහ අධීක්ෂණය සම්බන්ධ ප්‍රමාණවත් ආරක්ෂණ නොමැත. තවද, පාර්ලිමේන්තු අනුමැතිය ලැබීමට පෙර රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන බැවින්, පාර්ලිමේන්තුවේ නියෝජිත නීති සම්පාදනය (delegated legislation) පිළිබඳ පාලනය දුර්වල වේ.

ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය වූයේ PMLA පනත් කෙටුම්පත සමස්තයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන බවත්, ඇතැම් විධිවිධාන සංශෝධනය කළහොත් පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකි බවයි.[22] අපරාධවලින් උපයාගත් දේපළ අත්හිටුවීම සහ රාජසන්තක කිරීම සඳහා වූ පුළුල් කළ රාමුව මෙන්ම වර්ධනය කළ පරීක්ෂණ බලතල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ආරක්ෂණ විධිවිධානවලට පටහැණි නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අතර, **FATF ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ විරෝධී පාලන තන්ත්‍රය බලගැන්වීම සඳහා වන නීත්‍යානුකූල පියවරයන් ලෙස රාජ්‍යය විසින් ඉදිරිපත් කළ තර්කයන් අධිකරණය විසින් පිළිගන්නා ලදී.** කෙසේ වෙතත්, 14 වන වගන්තිය සහ 18 වන වගන්තියේ කොටස් අතිශය පුළුල් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 13(3) වගන්ති යටතේ සහතික කර ඇති සමානාත්මතාව සහ සාධාරණ ක්‍රියාපටිපාටිය පිළිබඳ ආරක්ෂණ උල්ලංඝනය කරන බව අධිකරණය තීරණය කළේය. ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ කළේ: අත්හිටුවීමේ නියෝග සඳහා වඩා දැඩි අධිකරණ අධීක්ෂණයක් සහ කාල සීමා හඳුන්වා දීම; පොලිස් භාරයේදී සිදුකරන ප්‍රකාශ සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනත යටතේ පවතින ආරක්ෂණ පවත්වා ගැනීම; අසත්‍ය සාක්ෂි ලබාදීම සම්බන්ධයෙන් සාක්ෂිකරුවෙකුට දඬුවම් කිරීමට පෙර වෙනම සාරාංශ නඩු විභාගයක් පැවැත්වීම යන සංශෝධන සිදුකළහොත් සමස්ත පනත් කෙටුම්පත සරල බහුතරයකින් සම්මත කළ හැකි බවය.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයෙන් පසුව, 2026 ජූලි 9 දින පාර්ලිමේන්තුව විසින් පනත් කෙටුම්පත සම්මත කරන ලදී. කෙසේ වෙතත්, සංශෝධනය කරන ලද්දේ එක් වගන්තියක් පමණි. 18 වන වගන්තිය සංශෝධනය කරමින්, සැකකරුවන් අත්අඩංගුවේ හෝ පොලිස් භාරයේ සිටියදී ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශවල පිළිගැනීමේ හැකියාව සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනත අදාළ වන බවත්, අසත්‍ය සාක්ෂි ලබාදීම සම්බන්ධයෙන් සාක්ෂිකරුවෙකුට දඬුවම් කිරීමට පෙර වෙනම සාරාංශ නඩු විභාගයක් පැවැත්විය යුතු බවත් ඇතුළත් කරන ලදී. කෙසේ වෙතත්, 14 වන වගන්තිය සම්බන්ධයෙන් අධිකරණය නිර්දේශ කළ අධිකරණ අධීක්ෂණය සහ කාල සීමා ඇතුළත් කිරීමේ යෝජනාව රජය විසින් නොසලකා හරින ලද අතර, එය විශේෂ බහුතරයකින් සම්මත කරන ලදී.

4. යෝජිත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ නීතිය

2024 දී රනිල් වික්‍රමසිංහ රජය විසින් රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචිය සහ අධීක්ෂණය) පනත ලෙස හඳුන්වා දුන් කෙටුම්පතක් සිවිල් සංවිධාන වෙත ඉදිරිපත් කරන ලදී. එහි අරමුණ වූයේ VSSO පනත වෙනුවට නව නීතියක් හඳුන්වා දීමයි. එම කෙටුම්පතේ විධිවිධාන අතිශය පුළුල් බවත්, නීත්‍යානුකූල සිවිල් සංවිධාන ක්‍රියාකාරකම් සීමා කිරීමට රාජ්‍යයට බලය ලබා දෙන බවත්, සමාගමයේ නිදහස දුර්වල කරන බවත් දක්වමින් සිවිල් සමාජය විසින් එය විවේචනය කරන ලදී. එම රජයේ ධුර කාලය තුළ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවීය.

[22] https://www.parliament.lk/en/business-of-parliament/bill-details/G6422

2025 ජූනි මාසයේදී අනුර කුමාර දිසානායක රජයේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් එම කෙටුම්පත තෝරාගත් සිවිල් සංවිධාන වෙත නැවත ඉදිරිපත් කරන ලදී. සිවිල් සංවිධාන විසින් නැවතත් එම කෙටුම්පත ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල නොවන බවත්, අධිකරණ අධීක්ෂණයකින් තොරව පොලිසියට සහ අනෙකුත් පරිපාලන ආයතනවලට පුළුල් සහ අත්තනෝමතික බලතල ලබා දෙන බවත්, එමඟින් සමාගමයේ (සංවිධානය වීමේ) නිදහස දුර්වල වන බවත් පෙන්වා දෙන ලදී. එසේ තිබියදීත්, 2026 ජූලි මාසයේදී රජය එම කෙටුම්පත නැවත ඉදිරිපත් කළ අතර, මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි (AML/CFT) සම්බන්ධ නව වගන්ති ඇතුළත් කරන ලදී. එම වගන්ති මඟින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම හඳුනා ගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන නිරීක්ෂණය කිරීමටත් සංවිධාන ක්‍රියාකාරකම් අත්හිටුවීමටත් නිසි බලධාරියාට බලය ලබා දෙයි.

මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි විධිවිධාන ඇතුළත් කිරීම මඟින්, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල නොවන, සමාගමයේ නිදහස දුර්වල කරන සහ සිවිල් අවකාශය සංකෝචනය කරන අතර, එම ක්‍රියාමාර්ග සාධාරණීකරණය කිරීමට FATF අවියක් ලෙස භාවිත කිරීමේ පෙර රජයන්ගේ උපායමාර්ගය වත්මන් රජයද අඛණ්ඩව ගෙන යන බව පෙන්නුම් කරයි. මෙයින් පෙනී යන්නේ රජය වෙනස් වුවද, FATF අවියක් ලෙස භාවිත කරමින් සිවිල් සංවිධාන ක්‍රියාකාරකම් පාලනය කිරීමේ අරමුණ පද්ධතිමය උපායමාර්ගයක් (systemic strategy) බවයි. රනිල් වික්‍රමසිංහ රජය හෝ අනුර කුමාර දිසානායක රජය යටතේ නීතිය සකස් කිරීමේදී සිවිල් සංවිධාන සමඟ කිසිදු උපදේශනයක් සිදු නොකළ බව සඳහන් කළ යුතුය. ජාතික නීති ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලද යන්න සමාලෝචනය කිරීමේ බලතල ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද නීතිය සකස් කිරීමේ ක්‍රියාවලියේදී උපදේශනයට ලක් කර නොමැත.[23]

මෙම කෙටුම්පත් නීතියේ විධිවිධාන කිහිපයක් 08 වන නිර්දේශය (Recommendation 8) සමඟ නොගැළපේ. උදාහරණයක් ලෙස, ලාභ නොලබන ක්‍රියාකාරකමක නිරත වන සියලුම සංවිධාන අනිවාර්යයෙන් ලියාපදිංචි වී නිසි බලධාරියාගේ **අධීක්ෂණයට** යටත් විය යුතුය. මෙයට පහත ආයතන ඇතුළත් වේ: අන්තර් රාජ්‍ය ගිවිසුමක් යටතේ පිහිටුවා නොමැති ජාත්‍යන්තර සංවිධාන; ක්ෂුද්‍ර මූල්‍ය ආයතන; භාර; ඇපකරයෙන් සීමිත සමාගම්; සංගම්; සභා; ප්‍රජා නේවාසිකාගාර; පදනම්; සමාජ ව්‍යාපාර; සාමාන්‍ය ජනතාවට සේවය කිරීම සඳහා පුද්ගලයන් පස් දෙනෙකු හෝ වැඩි පිරිසක් විසින් පිහිටුවන ලද, ස්වේච්ඡා සමාජ සේවාවක් හෝ ලාභ නොලබන ක්‍රියාකාරකමක නිරත වන කණ්ඩායම්. ලියාපදිංචි නොවීම යෝජිත නීතිය යටතේ වරදක් බවට පත් කර ඇත. මෙය FATF ප්‍රමිතීන්ට පටහැනි වන අතර, FATF විසින් අධීක්ෂණ ක්‍රියාමාර්ග හඳුනාගත් අවදානම් මත පදනම්ව සමානුපාතික සහ ඉලක්කගත විය යුතු බව අවධාරණය කරන අතර, සියලු සංවිධාන සඳහා පොදු වාර්තා කිරීමේ බැඳීම් පැනවීම අනුමත නොකරයි. සිවිල් සංවිධාන සමාගම් පනත යටතේ ඇපකරයෙන් සීමිත සමාගම් ලෙස හෝ භාර ආඥා පනත යටතේ භාර ලෙස ලියාපදිංචි වී ඇත්නම්, අදාළ නීති යටතේ දැනටමත් පවතින වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට යටත් වේ. එබැවින් ඒවා නැවත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට බල නොකළ යුතුය. මධ්‍යගත නිරීක්ෂණ ආයතනයක් FATF විසින් අවශ්‍ය කරන්නේ හෝ අනුමත කරන්නේ නැත.

FATF 08 වන නිර්දේශය (Recommendation 8) මඟින් FATF හි ලාභ නොලබන සංවිධාන නිර්වචනයට අයත් සියලුම සංවිධාන අතරින් ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අනිසි ලෙස භාවිත වීමේ "ඉහළ අවදානමක්" ඇති විය හැක්කේ සුළු කොටසකට පමණක් බව සඳහන් කරයි. කෙසේ වෙතත්, යෝජිත නීතිය සියලුම සංවිධාන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා අනිසි භාවිතයේ එකම මට්ටමේ අවදානමක් දරන බව සලකන දැඩි ආරක්ෂකකරණයට ලක් කළ (securitised) රාමුවක් භාවිත කරයි.

නිසි බලධාරියාට, විධායක කමිටුවේ සියලුම හෝ බහුතර සාමාජිකයන්ගේ ලිඛිත ඉල්ලීමක් මත හෝ සංවිධානයේ නිලධාරීන්ගේ එකඟතාව මත, රාජ්‍ය නොවන සංවිධාන විධායක කමිටු රැස්වීමකට සහභාගි විය හැකිය. නිසි බලධාරියා විසින් නිකුත් කරන ලියාපදිංචි සහතිකය වලංගු වන්නේ වසර තුනක් පමණක් වන අතර, ඉන්පසු නව අයදුම්පතක් මඟින් එය අලුත් කළ යුතුය.

යෝජිත නීතිය යටතේ සෑම ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානයකටම "ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට හෝ භෞමික අඛණ්ඩතාවයට අහිතකර ලෙස බලපාන කිසිදු ක්‍රියාකාරකමක නිරත වීම" හෝ "සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාවට සහ අවශ්‍යතාවලට බලපාන කිසිදු මහජන කැළඹීමක් ඇති කිරීම හෝ ඇති කිරීමට පෙළඹවීම" තහනම් කර ඇත. මෙම පද නිර්වචනය කර නොමැති බැවින්, ඒවා පුළුල් ලෙස අර්ථකථනය කර රජය විවේචනය කරන ක්‍රියාකාරකම් සහ මානව හිමිකම් කටයුතු පවා නීති විරෝධී ක්‍රියාකාරකම් ලෙස ලේබල් කිරීමට භාවිත කළ හැකිය.

[23] https://www.hrcsl.lk/press-notice-on-draft-non-governmental-organisations-registration-and-supervision-bill/

යෝජිත නීතිය මඟින් අධිකරණ සමාලෝචනයකට යටත් නොවන පුළුල් සහ අත්තනෝමතික බලතල නිසි බලධාරියාට සහ පොලිසියට ලබා දෙයි. උදාහරණයක් ලෙස, නිසි බලධාරියාට පොලිස් නිලධාරියෙකු සමඟ එක්ව, වරෙන්තුවක් නොමැතිව, නමුත් පූර්ව දැනුම්දීමකින් පසුව, ඕනෑම රාජ්‍ය නොවන සංවිධානයක පරිශ්‍රයට ඇතුළු වී එහි වාර්තා වෙත ප්‍රවේශ වීමට හෝ ඒවා පරීක්ෂා කිරීමට බලය ඇත. එමෙන්ම, නිසි බලධාරියාට රාජ්‍ය නොවන සංවිධාන වල කාර්යයන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමට, නිරීක්ෂණය කිරීමට සහ ඒවාට මැදිහත් වීමට සැලකිය යුතු බලතල ලබා දී ඇත. මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ මූල්‍ය අක්‍රමිකතාවක් පිළිබඳ ප්‍රථම දෘෂ්ඨාත්මක සාක්ෂි (prima facie evidence) ඇති විට මෙන්ම, රාජ්‍ය නොවන සංවිධාන එකක ක්‍රියාකාරකම් හෝ පැවැත්ම "ජාතික ආරක්ෂාවට, භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට අහිතකර හෝ තර්ජනයක්" වන අවස්ථාවලදී එහි ලියාපදිංචිය අත්හිටුවීමට ද නිසි බලධාරියාට බලය ලබා දී ඇත.

5.2. පරිපාලන උපදෙස් සහ මාර්ගෝපදේශ

1. චක්‍රලේඛ

අ. චක්‍රලේඛ අංක 01/19 [24]

2019 මැයි 23 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සියල්ල වෙත චක්‍රලේඛ අංක 01/19 නිකුත් කරන ලදී.

මෙම චක්‍රලේඛය 2016 අංක 01 දරන මුදල් ආයතන (පාරිභෝගික නිසි පරීක්ෂාව) හි 51 වන රීතිය වෙත යොමු වන අතර, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති රාජ්‍ය නොවන සංවිධානයකට විදේශ අරමුදල් ලැබෙන විට සෑම මූල්‍ය ආයතනයක්ම වැඩිදියුණු කළ පාරිභෝගික නිසි පරීක්ෂාව (enhanced due diligence) සිදු කළ යුතු බව නියම කරයි. අදාළ අවස්ථාවකදී, FTRA හි 7 වන වගන්තිය යටතේ බැංකුවට එම රාජ්‍ය නොවන සංවිධානය මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ හැකිය.

එම පනතේ 7 වන වගන්තිය අනුව, කිසියම් ගනුදෙනුවක් හෝ උත්සාහ කළ ගනුදෙනුවක් නීති විරෝධී ක්‍රියාවක් හෝ වෙනත් අපරාධයක් සිදුකිරීමට සම්බන්ධ විය හැකි බවට බැංකුවට සාධාරණ පදනමක් මත සැකයක් ඇත්නම්, එය මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දිය යුතුය. 7(2)(ඇ) වගන්තිය අනුව, බැංකුව විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ඉදිරිපත් කරන වාර්තාවේ "ආයතනයට එම සැකය ඇති වීමට හේතු වූ පදනම" සඳහන් කළ යුතුය. එනම්, සැකය සාධාරණ පදනමක් මත පදනම් විය යුතු අතර, එය අර්ථ විරහිත, ව්‍යාජ හෝ අත්තනෝමතික විය නොහැකිය.

චක්‍රලේඛ අංක. 01/2019 මඟින් රාජ්‍ය නොවන සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති නම් විදේශ අරමුදල් බැර කිරීම ප්‍රතික්ෂේප කළ යුතු බවක් නියම නොකරයි. චක්‍රලේඛය අනුව අවශ්‍ය කරන්නේ වැඩිදියුණු කළ පාරිභෝගික නිසි පරීක්ෂාවක් සිදු කිරීම පමණි. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති රාජ්‍ය නොවන සංවිධානයකට ලැබෙන අරමුදල් අපරාධයක් සිදු කිරීමට භාවිත විය හැකි බවට සාධාරණ සැකයක් ඇති අවස්ථාවකදී පමණක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මේ දක්වා රාජ්‍ය නොවන සංවිධානයකට රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති පමණින් විදේශ අරමුදල් බැර කිරීම ප්‍රතික්ෂේප කළ යුතු බවට වෙනත් කිසිදු නීතියක් හෝ රෙගුලාසියක් ද නොමැත.

කෙසේ වෙතත්, ප්‍රායෝගිකව බැංකු, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති රාජ්‍ය නොවන සංවිධාන වෙත ලැබෙන විදේශ අරමුදල් බැර කිරීම ප්‍රතික්ෂේප කරමින්, එම අරමුදල් ගිණුමට බැර කිරීමට අවශ්‍ය නම් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස ඉල්ලා සිටී. එමෙන්ම, අරමුදල් නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන බවට සාධාරණ සැකයක් නොමැති අවස්ථාවලදී පවා FTRA හි 7 වන වගන්තිය යටතේ රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා ඉදිරිපත් කරයි. මෙම තත්ත්වය බියකරු පරිසරයක් නිර්මාණය කරන අතර, සිවිල් සංවිධාන TID වෙත ප්‍රශ්න කිරීම සඳහා කැඳවීමට සහ ඔවුන්ට නිදහසේ ක්‍රියාත්මක වීමට බාධා කරයි.

[24] https://fiusrilanka.gov.lk/docs/Circulars/2019/Circular-01-2019.pdf

2025 අප්‍රේල් 4 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චක්‍රලේඛය අනුව ලියාපදිංචියට කාලයක් ගත විය හැකි බැවින්, "රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති බව තහවුරු කරන ලිපියක්" මත රාජ්‍ය නොවන සංවිධානවලට බැංකු ගිණුම් විවෘත කළ හැකි බව එහි සඳහන් වේ.

කෙසේ වෙතත්, රාජ්‍ය නොවන සංවිධානයකට බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා VSSO පනත යටතේ ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කිරීම හෝ අමාත්‍යාංශවලින් නිෂ්කාශනයක් ලබා ගැනීම නීතියෙන් නිමට කර නොමැත. උදාහරණයක් ලෙස, ලාභ නොලබන ඇපකරයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධානයකට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමඟ ලියාපදිංචි වී අදාළ ලේඛන බැංකුවට ඉදිරිපත් කර බැංකු ගිණුමක් විවෘත කළ හැකිය. තහවුරු කිරීමේ ලිපියක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ඇතුළත් කිරීම මඟින් චක්‍රලේඛය ලියාපදිංචිය සඳහා පවතින නීතිමය අවශ්‍යතා ඉක්මවා යයි.

2. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය අතර අවබෝධතා ගිවිසුම [26]

2024 නොවැම්බර් 6 දින, ශ්‍රී ලංකා මහ බැංකුව සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය "මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ජාතික වැඩසටහන ශක්තිමත් කිරීම" සඳහා අවබෝධතා ගිවිසුමකට (MOU) එළඹුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මාධ්‍ය නිවේදනයේ මෙසේ සඳහන් විය: "මුදල් විශුද්ධිකරණය / ත්‍රස්තවාදයට මුදල් සැපයීම (ML/TF) සහ ඒ හා සම්බන්ධ අපරාධ සඳහා රාජ්‍ය නොවන සංවිධාන (NGO) අවභාවිත කළ හැකි අතර, එමඟින් ජාතික හා ගෝලීය ආර්ථික හා මූල්‍ය පද්ධතිවල ස්ථාවරත්වයට තර්ජනයක් එල්ල විය හැකිය. මෙම අවබෝධතා ගිවිසුම (MOU) මඟින් ජාතික ලේකම් කාර්යාලය විසින් සිදු කරනු ලබන කටයුතු හෝ එවැනි කටයුත්තකට සම්බන්ධ යම් පුද්ගලයෙකුගෙන් පැන නඟින යම් සිදුවීමක්, පරීක්ෂණයක් හෝ නඩු පැවරීමක් පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමඟ හුවමාරු කර ගැනීමට පහසුකම් සලසනු ඇත. මෙය මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ඒ හා සම්බන්ධ අපරාධ වැළැක්වීම, හඳුනා ගැනීම සහ නඩු පැවරීමේදී වැදගත් අංගයක් වනු ඇත."

මෙම භාෂාව මඟින් සියලුම රාජ්‍ය නොවන සංවිධාන, විශේෂයෙන් "ජාතික මූල්‍ය පද්ධතිවල ස්ථාවරත්වයට" තර්ජනයක් ලෙස රාමු කර ඇත. මෙය FATF 08 වන නිර්දේශය (Recommendation 8) සමඟ පටහැනි වන අතර, එහි සඳහන් වන්නේ බොහෝ රාජ්‍ය නොවන සංවිධාන අවම අවදානමක් සහිත බැවින් ක්‍රියාමාර්ග සියලු දෙනාට පොදුවේ නොව ඉලක්කගතව ක්‍රියාත්මක කළ යුතු බවයි.

3. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් 2024 දෙසැම්බර් මාසයේ නිකුත් කළ උපදෙස් [27]

2024 දෙසැම්බර් 12 දින රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් දේශීය සහ ජාත්‍යන්තර සියලුම රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් නීතියක් යටතේ දැනටමත් ලියාපදිංචි වී තිබුණද, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස උපදෙස් නිකුත් කරන ලදී.

සිවිල් සංවිධාන ලියාපදිංචිය සඳහා අයදුම් කළ පසු, එම අයදුම්පත "නිෂ්කාශනය" සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට යවන බව එහි සඳහන් වේ. ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් "නිෂ්කාශන වාර්තා" ලැබුණු පසු, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය එම වාර්තාවල "ගැටලුවක්" ඇති බව සොයා ගන්නේ නම් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරන බව සඳහන් වේ.

එහෙත් "ගැටලුවක්" යන්න නිර්වචනය කර නොමැති අතර, ආරක්ෂක අමාත්‍යාංශ හෝ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් එවැනි තීරණයකට පැමිණීම සඳහා භාවිත කරන අපක්ෂපාතී නිර්ණායක දක්වා නොමැත. ලියාපදිංචි අයදුම්පත ප්‍රතික්ෂේප කළ විට ඒ සම්බන්ධයෙන් අභියාචනය කිරීමට ඇති ක්‍රමවේදයක් ද සඳහන් කර නොමැත. වෙනත් නීතියක් යටතේ දැනටමත් ලියාපදිංචි වී ඇති සංවිධානයක අයදුම්පත ප්‍රතික්ෂේප කළහොත් එම සංවිධානයේ තත්ත්වය කුමක් වන්නේද යන්න පිළිබඳවද සඳහනක් නොමැත.

[25] https://www.fiusrilanka.gov.lk/docs/Circulars/2025/Circular_01_2025.pdf
[26] https://ngosec.gov.lk/news-events/anti-money-laundering-measures-to-be-strengthened
[27] https://ngosec.gov.lk/news-events/notice

4. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ මාර්ගෝපදේශ[28]

2026 පෙබරවාරි මාසයේදී රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

විශාල පරිත්‍යාග ලබාගන්නා රාජ්‍ය නොවන සංවිධාන සහ දුරස්ථ ප්‍රදේශවල ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන අවදානම් සාධක ලෙස එම මාර්ගෝපදේශ හඳුනා ගනී. රාජ්‍ය නොවන සංවිධාන අවකාශය "අන්තවාදීකරණය (radicalisation) හෝ අන්තවාදී මතවාද ප්‍රවර්ධනය කිරීම" සඳහා භාවිත කිරීමද කනස්සල්ලට කරුණක් ලෙස දක්වා ඇත. කෙසේ වෙතත්, "radicalisation" හෝ "extremist ideologiess" යන පද නිර්වචනය කර නොමැති බැවින්, ඒවා රාජ්‍යයට අවශ්‍ය පරිදි පුළුල් ලෙස අර්ථකථනය කළ හැකිය. උදාහරණයක් ලෙස, IMF ගිවිසුම අවලංගු කරන ලෙස පෙනී සිටීම පවා "අන්තවාදී" ක්‍රියාවක් ලෙස සැලකිය හැකිය.

මෙම මාර්ගෝපදේශ මඟින් රාජ්‍ය නොවන සංවිධාන විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීම (AML/CFT) පිළිපදින බව තහවුරු කෙරෙන වාර්ෂික සහතික නිකුත් කිරීම මෙන්ම AML/CFT සඳහා සම්බන්ධීකාරකවරයෙකු පත් කිරීම ද අනිවාර්ය කරයි. කෙසේ වෙතත්, මේවා සියලුම ලාභ නොලබන සංවිධාන (NPOs) සඳහා ක්‍රියාත්මක කිරීමට FATF විසින් නියම කර ඇති අනිවාර්ය අවශ්‍යතාවලට ඇතුළත් නොවේ. විදේශීය ආධාරකරුවන් ස්වයංක්‍රියවම සැකකටයුතු ලෙස සලකනු ලබන අතර, මාර්ගෝපදේශවල දැක්වෙන්නේ සිවිල් සමාජ සංවිධාන (CSOs) විසින් ඒ සඳහා වැඩිදියුණු කළ පූර්ව පරීක්ෂාවන් (enhanced due diligence) සිදු කළ යුතු බවයි.

5.3. ලාභ නොලබන සංවිධාන පිළිබඳ ජාතික අවදානම් ඇගයීම

2026 ජනවාරි මාසයේදී රජය විසින් සිදුකරන ලද NPOs පිළිබඳ අවදානම් ඇගයීම (Risk Assessment) හි සාරාංශයක් ප්‍රකාශයට පත් කරන ලදී.[29] සම්පූර්ණ වාර්තාව FIU වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ (Right to Information) ඉල්ලීමක් හරහා ලබා ගන්නා ලදී.

මෙම වාර්තාවේ නිගමනය වන්නේ ලාභ නොලබන අංශයේ ස්වභාවික අවදානම අඩු සිට මධ්‍යම මට්ටම දක්වා වන බවයි. පරිසරය, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන "අඩු අවදානම්" ලෙස වර්ගීකරණය කර ඇති අතර, ඒ සඳහා හේතුව ලෙස එම කාණ්ඩ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අනිසි ලෙස භාවිත වූ බවට සාක්ෂි නොමැති බව දක්වා ඇත. එමෙන්ම, එම ව්‍යාපෘති බොහොමයක් භෞතිකව තහවුරු කළ හැකි බැවින් එවැනි රාජ්‍ය නොවන සංවිධාන සක්‍රීය ත්‍රස්තවාදී තර්ජනවලට සමීප නොවන බව ක්ෂේත්‍ර විශේෂඥයන්ගේ අදහස බව වාර්තාව සඳහන් කරයි.

මානව හිමිකම් සහ සහන සේවා සපයන රාජ්‍ය නොවන සංවිධාන මධ්‍යම-අඩු අවදානමක් ලෙස වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත්, පරිසර/සෞඛ්‍ය/සංවර්ධන සිවිල් සංවිධාන සමඟ සසඳන විට මෙම ඉහළ අවදානම් ශ්‍රේණිගත කිරීම සාධාරණීකරණය කිරීමට පිටු නවයකින් සමන්විත වාර්තාවේ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. වාර්තාව තවදුරටත් සඳහන් කරන්නේ ඉහළ අවදානම් ලෙස හඳුනාගත් ප්‍රදේශවල සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ලාභ නොලබන සංවිධාන කිහිපයක් බුද්ධි සේවා විසින් තවමත් නිරීක්ෂණය කරන බවයි. මෙයින් පෙන්නුම් කරන්නේ මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කරන සියලුම ලාභ නොලබන සංවිධාන සැකයෙන් යුතුව සලකන බවයි. එහෙත් එම සංවිධාන ඉහළ අවදානමක් ලෙස හඳුනාගැනීමට භාවිත කළ නිශ්චිත නිර්ණායක දක්වා නොමැත. එමෙන්ම, නම සඳහන් නොකළ සහ සංඛ්‍යාව නොදන්නා "ක්ෂේත්‍ර විශේෂඥයන්" මෙම ලාභ නොලබන සංවිධාන ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා අනිසි ලෙස භාවිත වීමට ලක්විය හැකි බවට අදහස් කරන බව වාර්තාව පවසයි. නැවතත්, මෙම ප්‍රකාශය සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත.

වාර්තාව අනාවරණය කරන්නේ ත්‍රස්ත විමර්ශන අංශය විසින් ලාභ නොලබන සංවිධාන කිහිපයක් සම්බන්ධයෙන් විමර්ශන සිදුකරන බවත්, ඒ අතරින් 13% ක් මානව හිමිකම් සංවිධාන වන අතර 80% ක් අධ්‍යාපන හා පුහුණු කටයුතු සිදුකරන සංවිධාන බවත්, 7% ක් සහන සේවා සපයන බවත්ය. මෙම වාර්තාව මඟින් නීතිමය සහ නියාමන රාමුවේ පවතින අඩුපාඩු (හිඩැස්) ලෙස සලකනු ලබන කරුණු මඟින් රාජ්‍යයේ සැබෑ අභිප්‍රාය, එනම් රාජ්‍ය නොවන සංවිධානවල (NPOs) ක්‍රියාකාරකම් පාලනය කිරීම සහ සීමා කිරීම එළිදරව් කරයි. උදාහරණයක්

[28] https://ngosec.gov.lk/images/download/guidelines/2026/AML%20CFT%20Guideline%20for%20NGOs%20English.pdf
[29] https://fiusrilanka.gov.lk/docs/Other/NRA_Report_2024-25/Sri_Lanka_NRA_on_ML_2024_25_Executive_Summary_E.pdf

ලෙස, VSSO පනත යටතේ ලියාපදිංචි නොවන සිවිල් සංවිධාන සඳහා දණ්ඩනීය ක්‍රියාමාර්ග නොමැති වීම සහ නැවත ලියාපදිංචි වීම සඳහා නීතිමය අවශ්‍යතාවක් නොමැති වීම "හිඩසක්" ලෙස හඳුනාගෙන ඇත. තවත් හිඩසක් ලෙස "ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන දේශපාලනීකරණයෙන් ඉවත් කිරීම සඳහා නිශ්චිත විධිවිධාන නොමැති වීම" දක්වා ඇත. එහෙත් මෙම සන්දර්භයේ "දේශපාලනීකරණය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද හෝ එය ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න පිළිබඳ කිසිදු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර නොමැත.

5.4. සංශෝධිත FATF 08 වන නිර්දේශය (Recommendation 8) සමඟ අනුකූල නොවීම

රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් පවතින වර්තමාන නියාමන ප්‍රමිතීන් සහ භාවිතයන් FATF මාර්ගෝපදේශ සමඟ ගැටේ. උදාහරණයක් ලෙස, ලාභ නොලබන සංවිධාන ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානමට ලක්ව තිබේද යන්න තීරණය කිරීම සඳහා රාජ්‍යයන් විසින් ඇගයීම් සිදුකළ යුතු බව FATF ඉල්ලා සිටී. එම ඇගයීම් මත පදනම්ව, හඳුනාගත් තර්ජනයේ මට්ටමට අනුරූප විශේෂිත නියාමන ප්‍රතිචාර අනුගමනය කළ යුතු අතර, සියලුම රාජ්‍ය නොවන සංවිධාන වෙත පොදු සීමා පැනවිය යුතු නොවේ. නීත්‍යානුකූල ලාභ නොලබන සංවිධාන හි කාර්යයන්ට බාධා නොවන පරිදි "ඉලක්කගත, සමානුපාතික සහ අවදානමට සංවේදී (targeted, proportionate, and risk-sensitive)" පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව FATF අවධාරණය කරයි. එහෙත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සියලු රාජ්‍ය නොවන සංවිධාන සඳහා පොදු ක්‍රියාමාර්ග නියම කරන අතර, එක් එක් රාජ්‍ය නොවන සංවිධාන වලින් ඇතිවන අවදානමේ මට්ටම පිළිබඳ ඇගයීමක් සිදු නොකරයි. එමඟින් ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය නොවන සංවිධාන හි ක්‍රියාකාරකම් සීමා වේ.

FATF හි වඩාත් යෝග්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ එකතුව මඟින් ප්‍රතිලාභීන් පිළිබඳ විස්තරාත්මක දත්ත, සියලුම පරිත්‍යාගශීලීන් හෝ හවුල්කාර සංවිධාන පිළිබඳ සම්පූර්ණයෙන් අනාවරණය කිරීම වැනි වෙනස්කම් නොසලකා, අධික සහ අවදානමට නොගැළපෙන අවශ්‍යතා FATF ප්‍රමිතීන් සමඟ නොගැළපෙන බව පෙන්වා දෙයි. එසේ වුවද, වර්තමාන රාජ්‍ය නොවන සංවිධාන වාර්තාකරණ ප්‍රමිතීන් පුළුල් හා සියල්ල ආවරණය කරන සීමා පනවන අතර, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන සහ යුක්තිය හා මානව හිමිකම් ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන සංවිධානවලට ඉතා දැඩි බලපෑමක් ඇති කරයි. මෙම කණ්ඩායම් නිරන්තරයෙන් ආරක්ෂක හා බුද්ධි අංශ නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීම්වලට ලක් වන අතර, අඛණ්ඩ අතිනීතික (extra-legal) නිරීක්ෂණ සහ බිය ගැන්වීම් අත්විඳිති.

2023 සිට FATF විසින් රාජ්‍යයන් ලාභ නොලබන සංවිධාන සම්බන්ධයෙන් "supervision" යන දැඩි පාලනයකට වඩා "monitor" හෝ "oversight" " එනම් නිරීක්ෂණය හෝ අධීක්ෂණය " පවත්වා ගත යුතු බව පැහැදිලි කර ඇත. මෙම වෙනස වැදගත් වන්නේ ලාභ නොලබන සංවිධාන මූල්‍ය ආයතන හෝ කැසිනෝ වැනි නිරන්තරයෙන් වාර්තාකරණය කළයුතු ආයතන (reporting entities) ලෙස වර්ගීකරණය කර නොමැති බැවිනි. මූල්‍ය ආයතන සහ කැසිනෝ සැක සහිත ගනුදෙනු මුල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට නීතියෙන් බැඳී සිටී. තවද, අතිශය දැඩි හෝ බාධාකාරී නියාමන ප්‍රවේශයන් 08 වන නිර්දේශය (Recommendation 8) යටතේ ලාභ නොලබන සංවිධාන පිළිබඳ යහපත් ක්‍රියාමාර්ග වලට පටහැනි බව FATF මාර්ගෝපදේශ සඳහන් කරයි. බොහෝ ලාභ නොලබන සංවිධාන අවම අවදානමක් ඉදිරිපත් කරන බවත්, ඔවුන් සතුව එලදායී අභ්‍යන්තර ආරක්ෂණ ක්‍රම තිබීම හෝ ඔවුන් දැනටමත් පවතින නියාමන පද්ධති යටතේ සිටීම එයට හේතුවක් බවත් FATF තහවුරු කරයි. එවැනි අවස්ථාවලදී "අතිරේක ක්‍රියාමාර්ග අනවශ්‍ය විය හැකිය."

ඉහත සඳහන් චක්‍රලේඛ අංක 01/2025 මඟින් VSSO පනත යටතේ ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය කාලය ගතවන සහ සංකීර්ණ ක්‍රියාවලියක් බව අවධාරණය කරමින්, විකල්ප/අතුරු තහවුරු කිරීමේ ලිපියක් අවශ්‍ය බව පෙන්වා දෙයි. මෙවැනි දැඩි හා අධික නියාමන පද්ධති පැනවීම, FATF විසින් ලබා දී ඇති නිර්දේශ සමඟ පටහැනි වේ.

තවද, FATF හි වඩා යෝග්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ එකතුවේ සඳහන් පරිදි, පුළුල් සහ පොදු නියාමන ක්‍රියාමාර්ග මූල්‍ය අංශය විසින් "සාධාරණීකරණය කළ නොහැකි, පුළුල් පරාසයක de-risking" ක්‍රියාමාර්ග ගැනීමට හේතු විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස ලාභ නොලබන ක්ෂේත්‍රයේ සංවිධානවලට මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති විය හැකිය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන බැංකු විසින් ක්‍රියාත්මක කරන "සමස්ත අවදානමෙන් ඉවත් වීම: ("wholesale de-risking") ක්‍රියාමාර්ග හේතුවෙන් තම අරමුදල් වෙත ප්‍රවේශ වීමට අරගල කරන තත්ත්වය මෙයට උදාහරණයකි.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග සමස්තයක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාත්මක වීමට අසීරු යෝග්‍ය නොවන පරිසරයක් නිර්මාණය කර ඇති අතර, එය ඔවුන් සිදුකරන කාර්යයන්ට සහ ඔවුන් සේවය කරන ප්‍රජාවන්ට බලපායි. රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි ශ්‍රී ලංකාවේ පවතින සැකය සහ ඒවා පාලනය හා සීමා කිරීම සඳහා ඇති විවිධ ක්‍රියාමාර්ග තිබියදීත්, මේ දක්වා කිසිදු රාජ්‍ය නොවන සංවිධානයකට ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කර නොමැති බව නැවත අවධාරණය කළ යුතුය.

ඒ වෙනුවට, රාජ්‍ය නොවන සංවිධාන අනවශ්‍ය පාලනයකට ලක් කිරීම සහ සැකයෙන් යුතුව සැලකීම පුරවැසියන්ගේ නිදහස් ප්‍රකාශනය, සමාගමයේ නිදහස සහ සාමකාමී රැස්වීම යන මූලික අයිතිවාසිකම් සීමා කරන අතර සිවිල් සමාජය සහ රාජ්‍යය අතර සම්බන්ධතාව දුර්වල කරයි.

6. FATF අවියක් ලෙස භාවිත කිරීමේ බලපෑම

6.1. බැංකු සේවා වෙත ප්‍රවේශය පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල

මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ක්‍රියාමාර්ග හේතුවෙන් පසුගිය වසර පහ තුළ ලාභ නොලබන සංවිධාන බැංකු සේවා වෙත ප්‍රවේශ වීමේදී මුහුණ දුන් දුෂ්කරතා පිළිබඳව 2025 දී සමීක්ෂණයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාව පුරා ලාභ නොලබන සංවිධාන වෙත ව්‍යුහගත, භාෂා තුනකින් සමන්විත ප්‍රශ්නාවලියක් මාර්ගගතව බෙදා හරින ලද අතර, පළාත් සියල්ල නියෝජනය කරමින් ප්‍රතිචාර 102ක් ලැබුණි. සංවිධානවල ස්වභාවය, බැංකු සේවා වෙත ප්‍රවේශ වීමේදී ඇතිවන ගැටලු, බැංකු ප්‍රතිචාර, එම අභියෝග කළමනාකරණය කිරීමට ලාභ නොලබන සංවිධාන භාවිත කළ උපායමාර්ග සහ එම දුෂ්කරතාවල සමස්ත මෙහෙයුම් බලපෑම සමීක්ෂණය මඟින් පරීක්ෂා කරන ලදී.

ප්‍රතිචාර දැක්වූ සංවිධාන බොහෝමයක් මානව හිමිකම් ආරක්ෂාව, දරිද්‍රතාව අවම කිරීම, ජීවනෝපාය සහාය සහ සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා සම්බන්ධයෙන් කටයුතු කර ඇත. මෙම කාර්යයන් බොහෝ විට ජනවාර්ගික හා ආගමික සුළුතරයන් සහ LGBTIQ කණ්ඩායම් ඇතුළු අවදානමට ලක්විය හැකි සහ ආන්තිකකරණයට ලක්වූ ප්‍රජාවන් වෙත සේවා සපයයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 21%ක් කාන්තාවන් විසින් නායකත්වය දරන සංවිධාන ලෙස හඳුනාගෙන ඇත.

සංවිධානවලින් අඩකට ආසන්න සංඛ්‍යාවක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන අතර, තුනෙන් එකකට වැඩි සංඛ්‍යාවක් ප්‍රජා මට්ටමේ සංවිධාන වේ. දිවයිනේ සියලුම ප්‍රදේශ නියෝජනය වුවද, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක සංවිධාන විසින් වැඩි දුෂ්කරතා වාර්තා කරන ලදී. බොහෝ සංවිධාන කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ වන අතර, පූර්ණකාලීන කාර්ය මණ්ඩලය 20 දෙනෙකු දක්වා ඇත.

සමීක්ෂණයේ ප්‍රතිචාරවලින් සියලුම ප්‍රතිචාර දැක්වූවන් මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේදී එකිනෙකට සම්බන්ධ බහුවිධ බාධාවන්ට මුහුණ දුන් බව පෙන්වා දෙන ලදී:

- 50%කට ආසන්න සංඛ්‍යාවක් නව බැංකු ගිණුම් විවෘත කිරීමේදී දුෂ්කරතාවලට මුහුණ දී ඇත.
- 69%ක් විදේශ අරමුදල් ලබාගැනීමේදී ගැටලු අත්විඳ ඇත. එයින් අවම වශයෙන් 42%කට, විදේශ අරමුදල් ලබාගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස බැංකු විසින් දන්වා ඇත.
- 37%ක ගෙන් ගනුදෙනු සම්පූර්ණ කිරීම සඳහා අමතර ලේඛන ඉල්ලා ඇත.
- 32%ක් බැංකු ගනුදෙනු ප්‍රමාදවීම් අත්විඳ ඇති අතර 22%ක් අරමුදල් තැන්පත් කිරීමේ හෝ ආපසු ගැනීමේදී දුෂ්කරතාවලට මුහුණ දී ඇත.
- 17%ක් පමණක් කිසිදු ගැටලුවක් අත්විඳ නොමැත.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් අඩකට වැඩි සංඛ්‍යාවකට (54%) මෙම සීමා සඳහා හේතු ලබා දී තිබුණද, එම පැහැදිලි කිරීම් එකිනෙකට නොගැළපුණු අතර ශ්‍රී ලංකා මහ බැංකු චක්‍රලේඛ සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාල ලියාපදිංචි අවශ්‍යතා පදනම් කරගත් බවක් පෙණුනි.

සමහර බැංකු ලාභ නොලබන සංවිධානවල ගනුදෙනු සිදුකිරීම සඳහා පරිත්‍යාගශීලීන්, ව්‍යාපෘති ක්‍රියාකාරකම් හෝ අරමුදල් භාවිත කරන ආකාරය පිළිබඳ අමතර ලේඛන හෝ සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇත. එසේම, සංවිධාන තම ආයතනික ව්‍යුහය සහ මූල්‍ය ප්‍රතිපත්ති ලේඛන නැවත නැවත ඉල්ලා සිටීම ඇතුළු හිරිහැර වාර්තා කර ඇත.

ප්‍රතිචාර මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් එල්ල වන පීඩනය උපුටා දක්වමින් බැංකු විසින් සමානුපාතික නොවන සහ අනීතික අවශ්‍යතා ක්‍රියාත්මක කරන රටාවක් පෙන්නුම් කරයි. NPOs වෙත ඇති මෙහෙයුම්මය ප්‍රතිවිපාක අතර:

- 45%කට පරිත්‍යාගශීලීන්ගේ හෝ ව්‍යාපෘතිවල කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වී ඇත.
- 37%ක් වැටුප් ගෙවීමේ දුෂ්කරතාවලට මුහුණ දී හෝ කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් කිරීමට සිදුවී ඇත.
- 31.5%ක් කීර්තිනාමයට හානි සිදුව ඇති බව වාර්තා කර ඇත.
- 29%ක් ප්‍රමාදවීම් ප්‍රතිලාභී ප්‍රජාවන්ට සේවා සැපයීමේ හැකියාවට සෘජුවම බලපෑ බව සඳහන් කර ඇත.

ලාභ නොලබන සංවිධාන භාවිත කළ උපායමාර්ග සම්බන්ධයෙන්:

- 43%ක් අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩි කාලයක් වෙන් කිරීමට සිදුවූ බව වාර්තා කර ඇත.
- 21%ක් ව්‍යාපෘති කල් දැමීමට සිදුවී ඇත.
- අනෙක් සංවිධාන බැංකු මාරු කිරීම, බැංකු කළමනාකරුවන් සමඟ සෘජුව සම්බන්ධ වීම හෝ විශාල ප්‍රමාණයක අමතර ලේඛන සැපයීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත.

6.2. සිද්ධි අධ්‍යයන – සිවිල් සමාජය සමඟ ගුණාත්මක සම්මුඛ සාකච්ඡා

පහත සිද්ධි අධ්‍යයන සම්මුඛ සාකච්ඡාවලට සහභාගී වූ පුද්ගලයන්ගේම වචනවලින් ඉදිරිපත් කර ඇත.

සිද්ධි අධ්‍යයනය 1

සිවිල් සංවිධානය පිහිටි ස්ථානය: **බස්නාහිර පළාත, ශ්‍රී ලංකාව**

ක්‍රියාත්මක වන ප්‍රදේශ: **ජාතික මට්ටමින් - ප්‍රමාණවත් සේවා නොලැබෙන සුළුතර ප්‍රජාවන් කෙරෙහි විශේෂ අවධානය**

ක්‍රියාත්මක ක්ෂේත්‍ර: **මානුෂීය සහ ආපදා ප්‍රතිචාර, සෞඛ්‍ය සහ ප්‍රජා සත්කාර, තරුණ සවිබලගැන්වීම සහ අධ්‍යාපනය**

වසර විස්සකට වැඩි කාලයක් පුරා අපි බැංකු ගිණුම් පවත්වාගෙන ගොස් ඇති අතර, විධිමත් ප්‍රදාන ගිවිසුම් සහ නියාමනය කරන ලද බැංකු මාර්ග හරහා අපගේ අරමුදල් ලබාගෙන ඇත. අපගේ ප්‍රධාන ගැටලුව බැංකු ගිණුම් විවෘත කිරීම නොව, අරමුදල් ලැබුණු පසු ඒවා වෙත ප්‍රවේශ වීමයි. විදේශීය ප්‍රේෂණ ලැබෙන සෑම අවස්ථාවකම ප්‍රමාදවීම් සහ ලේඛන සඳහා නැවත නැවත ඉල්ලීම් කරයි. අපගේ සංවිධානයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවූ අවස්ථාවලදී පවා වසර ගණනාවක් පුරා ගනුදෙනුකාර අනන්‍යතාව හඳුනාගැනීම (Know Your Customer - KYC) තොරතුරු නැවත නැවත ඉදිරිපත් කරන ලෙස අපගෙන් ඉල්ලා ඇත.

කෙටි කාලයක් තුළ සංවිධානයක පැතිකඩ (profile) කොපමණ වාරයක් වෙනස් විය හැකිදැයි මම විමසුවෙමි. එවැනි ප්‍රශ්න පවා මතු කිරීම ගැටලුවක් බවට පත්වේ. එක් බැංකුවක් සමඟ ඇති වූ දුෂ්කරතා හේතුවෙන් අවසානයේදී අපගේ විදේශ ප්‍රේෂණ ලබාගන්නා ගිණුම වෙනත් බැංකුවකට මාරු කළෙමු. අනෙකුත් බැංකු වඩාත් හිතකර බව පෙනුණද, තවමත් ප්‍රදාන ගිවිසුම්, අරමුදල් භාවිත කරන ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම් සහ ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ විස්තර ඉල්ලා සිටී. මෙතරම් දිගු කාලයක් අප සමඟ කටයුතු කිරීමෙන් පසු, අපගේ පරිත්‍යාගශීලීන් සහ අපගේ ක්‍රියාකාරකම්වල ස්වභාවය පිළිබඳව බැංකුවලට වඩා හොඳ අවබෝධයක් තිබිය යුතුය.

ප්‍රදානයේ ප්‍රමාණය අනුව පරීක්ෂාව තවදුරටත් වැඩි වන බව පෙනේ. විශාල ප්‍රදාන ලැබෙන විට, විදේශ මූලාශ්‍රවලින් එවැනි අරමුදල් ලබාගැනීමට දේශීය සංවිධානයකට හැකි වූයේ කෙසේදැයි වහාම ප්‍රශ්න කිරීමට පටන් ගනී. මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි (AML/CFT) ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකු උපදෙස් මත ක්‍රියාත්මක වන නමුත් ඒවා පිළිබඳව බැංකුවලටම නිසි අවබෝධයක් නොමැති බව අපට හැඟේ.

2019 පාස්කු ඉරිදා ප්‍රහාරවලින් පසුව පරීක්ෂාව සැලකිය යුතු ලෙස වැඩි විය. ආරක්ෂක ආයතන අපගේ ක්‍රියාකාරකම් සහ ප්‍රතිලාභීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට පටන් ගත්හ. ප්‍රතිලාභීන් සම්බන්ධ තොරතුරු පරීක්ෂා කර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය ඇතුළු රජයේ ආයතන සමඟ හුවමාරු කර, ඔවුන් "සැබවින්ම සුදුසු පුද්ගලයන්" දැයි පරීක්ෂා කරන ලදී.

ප්‍රහාරවලින් පසු දුෂ්කර වසරවලදී අපගේ කටයුතු බොහොමයක් දැනටමත් අඩු කර තිබූ අතර අප සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙමින් සිටියද, අප තවදුරටත් දැඩි පරීක්ෂාවකට ලක්වන බව හැඟුණි. මූල්‍ය ගනුදෙනුවල වගවීම සහ විනිවිදභාවය සඳහා මම සම්පූර්ණයෙන්ම සහාය දක්වන නමුත්, FATF සම්බන්ධ අවශ්‍යතා සැබෑ මූල්‍ය අපරාධ අවදානම් විසඳීමට වඩා සිවිල් සංවිධාන නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ක්‍රමයක් ලෙස වැඩි වැඩියෙන් භාවිත කරන බව මගේ විශ්වාසයයි.

මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ක්‍රියාමාර්ගවලින් ඔබ්බට යන පුළුල් ගැටලුවක්ද පවතී. සුළුතර ප්‍රජාවක් විසින් මෙහෙයවන සංවිධානයක් ලෙස, අනෙක් අයට වඩා අපව වැඩි සැකයකින් යුතුව සලකන බව අපට නිතර හැඟේ. සමහර අවස්ථාවලදී ජනවාර්ගික හෝ ආගමික අනන්‍යතාව පරීක්ෂාව ක්‍රියාත්මක

කරන ආකාරයට බලපාන බව පෙනේ. අපගේ අරමුදල් සම්පූර්ණයෙන්ම පාහේ විධිමත් බැංකු මාර්ග හරහා ස්ථාපිත ප්‍රදාන ලබාදෙන සංවිධානවලින් ලැබෙන අතර නීත්‍යානුකූල සංවර්ධන සහ මානුෂීය අරමුණු සඳහා භාවිත කරන බැවින් මෙය විශේෂයෙන්ම කනගාටුදායකය.

ක්‍රියාපටිපාටි ප්‍රායෝගික සහ සංවර්ධනය ඉලක්ක කරගත් ඒවා විය යුතුය. වර්තමානයේදී, අප වැනි සංවිධානවලට වගවීමට සහාය වීම වෙනුවට බාධා ඇති කරන බවක් හැඟේ.

සිද්ධි අධ්‍යයනය 2

සිවිල් සංවිධානය පිහිටි ස්ථානය: **උතුරු පළාත, ශ්‍රී ලංකාව**

ක්‍රියාත්මක වන ප්‍රදේශ: **උතුරු පළාත, නැගෙනහිර පළාත**

ක්‍රියාත්මක ක්ෂේත්‍ර: **වගවීම, යුක්තිය, මානව හිමිකම්, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සමාජ-ආර්ථික යුක්තිය**

දැඩි පරීක්ෂාව 2018-2019 පමණ වන විට ආරම්භ වූ අතර, එය අප විසින් රජයට එරෙහිව ගෙන ගිය නීතිමය නඩුව සමඟ සමපාත විය. සුළුතර අයිතිවාසිකම් සහ රාජ්‍ය වගවීම සම්බන්ධ ඉහළ ප්‍රසිද්ධියක් ඇති ක්‍රියාකාරකම්වල නිරත වන සෑම අවස්ථාවකදීම බැංකු සම්බන්ධ ගැටලු තීව්‍ර වේ. එම පරීක්ෂාව තවමත් අවසන් වී නැත. එක් අවස්ථාවකදී රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සහතිකයක් නොතිබූ බැවින් අපගේ බැංකුව සියලු ගනුදෙනු අවහිර කළේය. එබැවින් අපට එම බැංකුව අතහැරීමට සිදුවිය. කිසිදු නම්‍යශීලීභාවයක් නොමැත. අමතර ලේඛන ඉදිරිපත් කරන තුරු සියලු මූල්‍ය ක්‍රියාකාරකම් නතර වේ.

අප රාජ්‍ය නොවන සංවිධානයක් නොව ඇපකරයෙන් සීමිත සමාගමක් (Company Limited by Guarantee) ලෙස ලියාපදිංචි වී ඇති බැවින් රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට අප අයත් නොවන බව පැහැදිලි කරමින් ගණන් කළ නොහැකි ලිපි සහ ඊමේල් යවා ඇත. සමහර අවස්ථාවලදී ශාඛා කාර්ය මණ්ඩලය පවසන්නේ "ඉහළ නිලධාරීන්" මෙම නීති ක්‍රියාත්මක කරන බැවින් ඔවුන්ට කිසිවක් කළ නොහැකි බවයි. අපගේ ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ නිසා, වසංගතය සහ ආර්ථික අර්බුදය අතරතුර පවා අපගේ මානව හිමිකම් මෙහෙයුම් නතර කිරීමට සිදුවූ අවස්ථා කිහිපයක් තිබුණි. එක් අවස්ථාවකදී පරිත්‍යාගශීලියෙකු අපට අරමුදල් එවූ අතර, ඒවා නිෂ්කාශනය වී ඇති බව අප සිතුවෙමු. නමුත් බැංකුව එම අරමුදල් අපට දැනුම් නොදී වසරකට ආසන්න කාලයක් අත්හිටුවා තිබුණි. බැංකුව අපට අවසාන කොන්දේසියක් ඉදිරිපත් කළේය: රහස්‍ය ව්‍යාපෘති දත්ත ලබා දෙන්න, නැතහොත් මුදල් ආපසු යවනු ලැබේ.

අපි එම අරමුදල් ආපසු යවන ලෙස ඉල්ලා සිටියේ රහස්‍ය තොරතුරු සහ පැහැදිලිවම ව්‍යාපෘති ලේඛන පමණක් වන ඒවා තෙවන පාර්ශ්වයන් වෙත ලබාදීමට අපට අවශ්‍ය නොවූ බැවිනි. සම්මත ගනුදෙනුවක් බැංකුවෙන් නිදහස් කරගැනීම සඳහා රහස්‍ය ව්‍යාපෘති විස්තර භාරදිය යුතු බවට කිසිදු බැංකු නීතියක සඳහන්ව නැත; එහෙයින් අපි අපගේ ස්ථාවරයේ ස්ථිරව සිටියෙමු.

අපගේ පරිත්‍යාගශීලීන් සමඟ ශක්තිමත් සම්බන්ධතාවයක් ඇති විට, ඔවුන් අවදානම් අවබෝධ කරගෙන අපට බැංකු සමඟ බෙදාගත හැකි සංශෝධිත (redacted) ගිවිසුම් ලේඛන ලබාදීම වැනි අමතර පියවර ගැනීමට කැමැත්තෙන් සිටී. නමුත් සියලු පරිත්‍යාගශීලීන් එසේ නොවේ. මෙම ගැටලු හේතුවෙන් සමහර පරිත්‍යාගශීලීන් අපට අරමුදල් ලබාදිය නොහැකි බව පවසා ඇත. අපගේ ව්‍යාපෘති අරමුදල් මාස ගණනක් බැංකු පද්ධතිය තුළ අත්හිටුවා ඇති බැවින් ජාත්‍යන්තර පරිත්‍යාගශීලීන්ගෙන් අමතර වියදමකින් තොර කාල දිගු (no-cost extensions) නිරන්තරයෙන් ඉල්ලා සිටීමට සිදුවේ.

මෙය ව්‍යාපෘති කාලසටහන්වලට බාධා කරයි, කාර්ය මණ්ඩල මාරුවීම් ඇති කරයි සහ නව කණ්ඩායම් පුහුණු කිරීමට විශාල ශක්තියක් වැය කිරීමට සිදුවේ. විගණකවරු විවිධ ව්‍යාපෘති සඳහා වෙන වෙනම ගිණුම් පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටියද, වර්තමාන රෙගුලාසි යටතේ නව බැංකු ගිණුම් විවෘත කිරීම ඉතා දුෂ්කරය.

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවට අප අනතුරු ඇඟවූ විට බැංකු නිලධාරීන් පසුබසිති. ඔවුන් කිසිවක් ලිඛිතව ලබා නොදෙන්නේ එවැනි ඉල්ලීම් සඳහා නීතිමය පදනමක් නොමැති බව ඔවුන් දන්නා බැවිනි. ඔවුන් දුරකථන සංවාද හරහා සන්නිවේදනය කරන අතර, එමඟින් ඔවුන්ගේ අත්තනෝමතික ඉල්ලීම් පිළිබඳ වාර්තාවක් ඉතිරි නොවේ. රාජ්‍යය සංකීර්ණ මූල්‍ය සහ නීතිමය පාරිභාෂික භාෂාව හිතාමතාම බිය ගැන්වීමේ උපක්‍රමයක් ලෙස භාවිත කරන බව අපට හැඟේ.

ගනුදෙනු අත්හිටුවීමට බලය ලබා දෙන නිශ්චිත නීතිමය විධිවිධාන ඉල්ලා බැංකු කළමනාකරුගෙන් ලිඛිත පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමට පටන්ගත් පසු ඔවුන්ගේ ආකල්පය වෙනස් විය. මෙයින් පෙන්නුම් කරන්නේ මේවා

බැංකුව විසින් පනවන ලද නීතියට පිටින් ගිය අවශ්‍යතා බවයි. ඉහළ ප්‍රසිද්ධියක් ඇති සිදුවීමකට අප සහභාගී වන විට හදිසියේම මෙම බැංකු බාධා මතුවන්නේ මන්දැයි අපි නිරන්තරයෙන් කල්පනා කරමු " අපගේ පෙනී සිටීමෙන් රාජ්‍යය කුපිත වන බවක් පෙනේ. අපට කිසිවිටෙක ආරක්ෂිත බවක් දැනෙන්නේ නැත.

මෙම නිමක් නැති නිලධාරිවාදය අපගේ කණ්ඩායමට ඇති කරන කාල, ශක්ති සහ මානසික පීඩනය පිළිබඳව කිසිවෙකු කතා නොකරයි. එක් අවස්ථාවකදී අපි සංවිධානය සම්පූර්ණයෙන්ම වසා දැමීමට පවා සලකා බැලුවෙමු.

අපගේ සෑම දුරකථන ඇමතුමක්, ඊමේල් පණිවිඩයක් සහ රැස්වීමක්ම රාජ්‍ය බුද්ධි අංශ විසින් නිරීක්ෂණය කරන බව උපකල්පනය කරමින් අපි කටයුතු කරමු. අපගේ කණ්ඩායම ආරක්ෂිතව තබා ගැනීමට අපට හැකි වූ එකම ක්‍රමය එම නිරන්තර අවධානයයි. මෙවැනි තත්ත්වයක් යටතේ ජීවත් වීම සහ වැඩ කිරීම ඉතා වෙහෙසකරය. අපට සැඟවීමට කිසිවක් නැත. ඔවුන්ට ඕනෑම වේලාවක අපගේ කාර්යාලයට පැමිණ අපගේ මහජන ලේඛන විගණනය කළ හැකිය. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන සම්බන්ධීකෘත බිය ගැන්වීම් සහ අත්තනෝමතික බැංකු බාධා සිවිල් අවකාශය මර්දනය කිරීම සඳහා රාජ්‍යය විසින් ක්‍රියාත්මක කරන උපායමාර්ගයක් ලෙස පෙනේ.

අපි ඇපකරයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි වූයේ වාර්ෂිකව විගණනය කළ ගිණුම් ඉදිරිපත් කරන පූර්ණ විනිවිදභාවයකින් යුත් ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමටය. කෙසේ වෙතත්, ත්‍රස්ත විමර්ශන අංශය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න කිරීම් අතරතුර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස වාචිකව අපට බලපෑම් කර ඇත.

මෙම පරිසරය සිවිල් සමාජය තුළ භයානක ධූරාවලියක් නිර්මාණය කරයි. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ඇති විශාල සහ සම්බන්ධතා ඇති රාජ්‍ය නොවන සංවිධාන හට ජාත්‍යන්තර අරමුදල් පහසුවෙන් ලබාගත හැකි අතර, කුඩා බිම් මට්ටමේ සංවිධාන අවාසිදායක තත්ත්වයකට පත්වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අපට මෙම විශාල සංවිධාන මත මූල්‍යමය වශයෙන් යැපීමටත්, කුඩා ප්‍රාදේශීය උප-ප්‍රදාන ලබාගැනීමට ඔවුන් මත රඳා සිටීමටත් සිදුවේ. මෙය බිම් මට්ටමේ සංවිධානවල මූල්‍ය ස්වාධීනත්වය අහිමි කරන, එමෙන්ම, ඔවුන්ගේ පෙනී සිටීම දුර්වල කරන සහ පැවැත්ම සඳහා විශාල රාජ්‍ය නොවන සංවිධාන සමඟ අනුගත වීමට ඔවුන්ට බල කරන පසුබිමක් නිර්මානය කරයි.

සිද්ධි අධ්‍යයනය 3

සිවිල් සංවිධානය පිහිටි ස්ථානය: **බස්නාහිර පළාත, ශ්‍රී ලංකාව**

ක්‍රියාත්මක වන ප්‍රදේශ: **ජාතික මට්ටමින්**

ක්‍රියාත්මක ක්ෂේත්‍ර: **ශ්‍රී ලංකාවේ LGBTIQ+ පුද්ගලයන් සඳහා සමාන අයිතිවාසිකම්, නීතිමය ආරක්ෂාව සහ ඇතුළත්කරණය ප්‍රවර්ධනය කිරීම**

අපගේ සංවිධානය බැංකු ගිණුම් විවෘත කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී සැලකිය යුතු අභියෝගවලට මුහුණ දී ඇත. මෙම දුෂ්කරතා LGBTIQ සංවිධානයක් ලෙස අපගේ අනන්‍යතාව සමඟ සම්බන්ධ බව අපි විශ්වාස කරමු. වර්තමානයේ අපට බැංකු දෙකක ගිණුම් තිබුණද, විදේශ ප්‍රේෂණ ලබාගත හැක්කේ ඉන් එක් බැංකුවක් හරහා පමණි. බැංකු කිහිපයක් අපගේ මුල් අයදුම්පත් පැහැදිලි හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කළ අතර, ගිණුම් විවෘත කළ පසුව පවා අපගේ නීතිමය තත්ත්වය, ලියාපදිංචිය සහ LGBTIQ ප්‍රජාවන් සමඟ කරන කාර්යය සම්බන්ධයෙන් අමතර පරීක්ෂාවකට ලක් විය.

බරපතළම ගැටලු මතුවූයේ අපගේ එක් බැංකුවක් විදේශ අරමුදල් ලබාගැනීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය අවශ්‍ය බව ඉල්ලා සිටීමත් සමඟය. භාරයක් ලෙස නීත්‍යානුකූලව ක්‍රියාත්මක වෙමින් පුළුල් ලේඛන ඉදිරිපත් කළද, අවසානයේ බැංකුව පරිත්‍යාගශීලියා එවූ අරමුදල් ආපසු යවා අපගේ ගිණුම් හරහා විදේශ ගනුදෙනු කිරීමට ඉඩ දීම නතර කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස අපට රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට සිදුවිය.

නමුත් වසර දෙකකට වැඩි කාලයකට පසුවද, ආරක්ෂක අමාත්‍යාංශයේ නිෂ්කාශනය නොමැති වීම හේතුවෙන් අපගේ අයදුම්පත තවමත් පොරොත්තු තත්ත්වයේ පවතී. මෙම ක්‍රියාවලිය අතරතුර අපගේ කාර්යාල, වැඩසටහන් සහ කාර්ය මණ්ඩලය රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, බුද්ධි අංශ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පැමිණීම් සහ නිරීක්ෂණවලට ලක් විය.

සමහර කාර්ය මණ්ඩල සාමාජිකයන් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සඳහා තම තොරතුරු ලබාදීමට බිය වූහ. LGBTIQ සංවිධානයක සේවය කරන බව ඔහුගේ දෙමාපියන් නොදැන සිටි කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ නිවසට පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පැමිණියහ. පොලිස් නිලධාරීන් ඔහුගේ රැකියාව පිළිබඳව ප්‍රශ්න කළ අතර LGBTIQ පුද්ගලයන් සම්බන්ධයෙන් අහිතකර අදහස් ද පළ කළහ.

එක් අවස්ථාවකදී පොලිස් නිලධාරියෙකු කිසිදු දැනුම්දීමකින් තොරව අපගේ ප්‍රධාන කාර්යාලයට පැමිණීමට උත්සාහ කළ අතර, එය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කොටසක් බව අවධාරණය කළේය. එම නිලධාරියා විසින් අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පෞද්ගලික නිවෙස් වෙත පැමිණීම ඇතුළු නුසුදුසු සහ වෘත්තීයමය නොවන ඉල්ලීම්ද සිදු කරන ලදී. අපගේ පුහුණු වැඩසටහන් පවත්වන හෝටල් සහ ස්ථාන, සංවිධානයේ නම, වේලාව සහ සහභාගිවන්නන්ගේ තොරතුරු වැනි වැඩසටහන් විස්තර ප්‍රාදේශීය පොලිසිය වෙත වාර්තා කළ යුතු බව අපට දැනගැනීමට ලැබුණි.

LGBTIQ ප්‍රජාවන් සමඟ කටයුතු කරන සංවිධානයක් ලෙස, අපගේ බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයන් තම ජීවනෝපාය සඳහා සම්පූර්ණයෙන්ම මෙම රැකියාව මත රඳා සිටී. වැටුප්, කුලී සහ කාර්ය මණ්ඩලයේ මූලික මෙහෙයුම් වියදම් ආවරණය වන බව සහතික කිරීම මගේ වගකීමයි. සමහර ආධාරක සංවිධාන ඉතා අවබෝධයෙන් සහ නම්‍යශීලීව කටයුතු කළහ. නමුත් නැවත නැවත ඇති වූ බැංකු සීමා සහ ප්‍රමාද හේතුවෙන් අනෙකුත් ආධාරක සංවිධාන කනස්සල්ල සහ සැක පළ කළහ. බැංකුවට අරමුදල් අපගේ ගිණුමට බැර කළ නොහැකි නම්, මුදල් ආධාරක සංවිධාන වෙත ආපසු යවා, අපට යොමු කිරීමේ අංකයක් ලබාදෙන ලෙස අපි ඉල්ලා සිටියෙමු.

එහෙත් ඔවුන් එය මෙතරම් කාලයක් ප්‍රමාද කළ නිසා ආධාරක සංවිධාන නිරන්තරයෙන් යාවත්කාලීන තොරතුරු ඉල්ලා සිටි අතර අවසානයේ බැංකු ගැටලු හේතුවෙන් අප සමඟ කටයුතු කිරීම නතර කළේය. බැංකු ගැටලු විසඳීමට අප උත්සාහ කරමින් සිටියදී ගිවිසුම් අවසන් වීම හේතුවෙන් අරමුදල් ලබා ගැනීමේ අවස්ථාද අපට අහිමි විය. අරමුදල් වෙත ප්‍රවේශ වීමට නොහැකි වීම හේතුවෙන් අවම වශයෙන් ව්‍යාපෘති දෙකක් අතර මැදදී නතර කිරීමට සිදුවිය.

සිවිල් සංවිධාන වෙත අනුකූලතා අවශ්‍යතා බැංකු විසින් ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් ස්ථාවරභාවයක් නොමැති බව අපගේ අත්දැකීමයි. විවිධ බැංකු අතර පමණක් නොව, එකම බැංකුවේ විවිධ ශාඛා අතර පවා NGO ලියාපදිංචිය සහ විදේශ අරමුදල් වෙත ප්‍රවේශය සම්බන්ධයෙන් විවිධ ප්‍රමිතීන් ක්‍රියාත්මක වේ.

සිද්ධි අධ්‍යයනය 4

සිවිල් සංවිධානය පිහිටි ස්ථානය: **බස්නාහිර පළාත, ශ්‍රී ලංකාව**

ක්‍රියාත්මක වන ප්‍රදේශ: **උතුරු පළාත, නැගෙනහිර පළාත, උතුරු මැද පළාත, මධ්‍යම පළාත**

ක්‍රියාත්මක ක්ෂේත්‍ර: **යහපාලනය, කාන්තා සවිබලගැන්වීම, සංහිඳියාව සහ යුක්තිය, තරුණ පුරවැසි සහභාගිත්වය**

අපි මෙම බැංකුව සමඟ වසර විසිදෙකක් තිස්සේ සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇති අතර, මේ වන විට ගිණුම් පහක් හෝ හයක් පවත්වාගෙන යමු. අතීතයේදී අරමුදල් වාරිකයක් ලැබෙන සෑම අවස්ථාවකම, කිසියම් ආධාරක සංවිධානයකින් කිසියම් ව්‍යාපෘතියක් සඳහා අරමුදල් ලැබුණු බවත් එම අරමුදල් ව්‍යාපෘති අරමුණු සඳහා භාවිත කරන බවත් සඳහන් කරමින් සරල ලිපියක් බැංකුවට යැවීම ප්‍රමාණවත් විය. නමුත් 2019 පමණ වන විට තත්ත්වය වෙනස් වීමට පටන් ගත්තේය. බැංකුව අප රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇත්දැයි විමසීමට පටන් ගත්තේය. අපි ලාභ නොලබන ඇපකරයෙන් සීමිත සමාගමක් වන අතර, එම කාලයේදී රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලබාගැනීම අප විසින් සලකා බලමින් සිටියෙමු. අපි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය සමඟ රැස්වීමක් පැවැත්වූ අතර, LGBTQI කණ්ඩායම් සමඟ හෝ ඉහළ දේශපාලනික හා මානව හිමිකම් කටයුතු සිදු නොකරන ලෙස ඔවුන් අපට පැවසූහ. එම අත්දැකීමෙන් පසුව අප ලියාපදිංචි නොවීමට තීරණය කළෙමු.

2019 සිට බැංකුව සෑම වසරකම NGO ලියාපදිංචිය පිළිබඳව විමසයි. මෙය කෙතරම් අඛණ්ඩ ගැටලුවක් වී තිබේද යත්, දැන් එය අපගේ විගණකවරුන්ගේ කළමනාකරණ ලිපියේ (management letter) නැවත නැවත සඳහන් වන කරුණක් බවට පත්ව ඇත. නීතිය යටතේ අප ලාභ නොලබන සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති අතර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය ලබාගැනීමට අවශ්‍ය නොවන බව අප නැවත නැවත පැහැදිලි කර ඇත. කෙසේ වෙතත්, බැංකු එය අපේක්ෂා කරන බැවින් එය නොමැති වීම අනුකූලතා ගැටලුවක් බව විගණකවරයාගේ ස්ථාවරය විය. මෙය ආධාරක සංවිධාන සමඟද ගැටලු ඇති කර ඇත. සමහර

ආධාරක සංවිධාන කළමනාකරණ ලිපිය සමාලෝචනය කර ශ්‍රී ලංකාවේ නිසි ලෙස ක්‍රියාත්මක වීමට අපට හැකිදැයි ප්‍රශ්න කරති.

2023 දී පළමු වරට අරමුදල් රඳවා තැබීමේ සිද්ධියකට මුහුණ දුන්නෙමු. රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී නොමැති බැවින් ලියාපදිංචි වීම හෝ ලියාපදිංචිය සඳහා පියවර ගෙන ඇති බවට සාක්ෂි ලබාදීම සිදු නොකළහොත් අරමුදල් බැර නොකරන බව බැංකු නිලධාරියෙකු අපට පැවසීය. අපි බැංකුවෙන් එම අවශ්‍යතාව සඳහා නීතිමය පදනම ඉල්ලා සිටි අතර, අවශ්‍ය නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද දැනුම් දුන්නෙමු. එය සිදු කළ පසු අරමුදල් මුදා හරින ලදී. එතැන් සිට අපි වාරිකයක් ලැබෙන සෑම අවස්ථාවකම පෙර පැවති ආකාරයට ලිපියක් ඉදිරිපත් කරමින් කටයුතු කළද, බැංකුවේ ස්ථාවරය නැවත වෙනස් වේද යන්න පිළිබඳ නිරන්තර අවිනිශ්චිතතාවක් පවතී.

තවත් බැංකු ගිණුමක් විවෘත කිරීමට උත්සාහ කළ විට, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය අවශ්‍ය බව බැංකුව පැවසීය. අපට දැනටමත් සමාගම් ලියාපදිංචිය ඇති බව පෙන්වා දුන් විටද, ඔවුන් අවධාරණය කළේ විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය අවශ්‍ය බවයි. එම අවශ්‍යතාව ලිඛිතව ලබාදෙන ලෙස ඉල්ලා සිටි විට ඔවුන් එය ප්‍රතික්ෂේප කළහ. මෑතකදී තවත් බැංකු ගිණුමක් විවෘත කිරීමට උත්සාහ කළ විට බැංකුව අයදුම්පත භාරගත් අතර එය මට පුදුමයක් විය. නමුත් අද වන තුරු ගිණුම විවෘත කර නොමැත. මාස තුනක් ගත වී ඇති අතර ඔවුන් තවමත් පවසන්නේ "කාලය ගත වෙමින් පවතින" බවයි. එබැවින් කිසිදු ස්ථාවරභාවයක් නොමැත. අපගේ දිස්ත්‍රික් කණ්ඩායම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රශ්න කිරීමට ලක් කළ බැවින්, පරීක්ෂාව පිළිබඳ කනස්සල්ල හේතුවෙන් අපි අපගේ අරමුදල් මූලාශ්‍ර හිතාමතාම සීමා කර ඇත. එබැවින් වසර ගණනාවක් පුරා අප කටයුතු කළේ එක්සත් ජාතීන්ගේ ආයතන සහ පුළුල් ලෙස පිළිගත් ස්ථාපිත ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වෙතින් පමණක් අරමුදල් ලබා ගැනීමයි.

තුස්ත විමර්ශන අංශය විසින් මා ප්‍රශ්න කළ අවස්ථාවේදී, අපගේ පරිත්‍යාගශීලීන් කවුද, පෞද්ගලික අරමුදල් අප පිළිගන්නේද සහ සමූහ අරමුදල් රැස්කිරීම (crowdfunding) භාවිත කරන්නේද යන්න විශේෂයෙන් විමසන ලදී. වෙනත් සංවිධානයක සමූහ අරමුදල් රැස්කිරීම සම්බන්ධයෙන් අප සොයා බැලූ අවස්ථාවකදී, දැනගන්නට ලැබුනේ නිර්නාමික දායකයන් කිසිවෙකු මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ නොවන බවට පුද්ගලික නිලධාරියෙකු විසින් සහතිකයක් ලබා නොදුන්නේ නම් බැංකුව එම ක්‍රියාවලියට අවසර දීම ප්‍රතික්ෂේප කළ බවයි. එවැනි සහතිකයක් ලබාදීමට කිසිවෙකු කැමති නොවන බව පැහැදිලිය.

සිද්ධි අධ්‍යයනය 5

සිවිල් සංවිධානය පිහිටි ස්ථානය: **මඩකලපුව, නැගෙනහිර පළාත, ශ්‍රී ලංකාව**

ක්‍රියාත්මක වන ප්‍රදේශ: **නැගෙනහිර පළාත**

ක්‍රියාත්මක ක්ෂේත්‍ර: **ලිංගික සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (sexual and gender based violence - SGBV) අත්විඳි දිවිගලවාගත් පුද්ගලයන් සඳහා හදිසි සේවා, කාන්තා ප්‍රාදේශීය පාලනය සහ පර්යේෂණ, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටීම - මුස්ලිම් කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානය**

2019න් පසු එක් ජාත්‍යන්තර අරමුදලකින් අපට අරමුදල් ලැබුණු අවස්ථාවේදී, අනාගතයේදී එවැනි අරමුදල් ලබාගැනීමට සහ ආපසු ගැනීමට අවසර ලැබෙන්නේ රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සංවිධානවලට පමණක් බව බැංකුව අපට දැනුම් දුන්නේය. බැංකුව රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ ලිපියක් පදනම් කරගත් අතර, ඒ මත පදනම්ව අරමුදල් වෙත ප්‍රවේශය නතර කළේය. එම අවස්ථාවේදීම එම අරමුදලම ලබාගත් වෙනත් සංවිධානයකට වෙනත් බැංකුවක් හරහා එම මුදල් ලබාගැනීමට හැකි විය. මෙයින් මට අවබෝධ වූයේ විවිධ බැංකු අතර සැලකීම සැලකිය යුතු ලෙස වෙනස් ක්‍රම විධින් ක්‍රියාත්මක් වන බවයි. අපගේ බැංකු කළමනාකරු සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මුදල් ආපසු ගැනීමට ඔහු එකඟ වූ නමුත්, අනාගතයේදී විදේශ අරමුදල් ලබාගැනීමට පෙර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු බවට කොන්දේසියක් පනවන ලදී.

2024 වන විට අරමුදල් අවස්ථා වැඩි වැඩියෙන් සීමා වෙමින් තිබූ අතර, නව රාජ්‍ය නොවන සංවිධාන නීති පිළිබඳ සාකච්ඡා ද පැවතුණි. සමහර ආධාරක සංවිධාන රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටියහ. එබැවින් අපි අකමැත්තෙන් වුවද ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට තීරණය කළෙමු. කෙසේ වෙතත්, එම තීරණය අපට අතිශය දුෂ්කර තත්ත්වයක් බවට පත්ව ඇත.

ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය ආරම්භ කර මේ වන විට වසර දෙකකට ආසන්න කාලයක් ගත වී ඇති අතර, අප තවමත් බලා සිටින අතරම ඒ සඳහා විශාල මිලක් ගෙවමින් සිටිමු.

අපගේ සංවිධානයේ ලියාපදිංචි තොරතුරු, මණ්ඩල තොරතුරු, ප්‍රතිලාභී ප්‍රදේශ, ප්‍රාදේශීය ලේකම් අනුමැතිය සහ පොලිස් නිෂ්කාශන ඇතුළු අවශ්‍ය සියලු ලේඛන ඉදිරිපත් කළෙමු. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු, ලේඛන පිළිගෙන ඇති බවත් ලියාපදිංචිය පසුව නිකුත් කරන බවත් තහවුරු කරන ලිපියක් අපට ලැබුණි. නමුත් එතැන් සිට හමුදාව, යුද හමුදාව, පොලිසිය සහ අනෙකුත් බලධාරීන්ගේ නැවත නැවත පැමිණීම් සහ ප්‍රශ්න කිරීම්වලට අප මුහුණ දුන්නෙමු. ඔවුන් ඉල්ලා සිටි තොරතුරු අප අපේක්ෂා කළ සීමාව ඉක්මවා ගිය අතර, අපගේ පරිත්‍යාගශීලීන් සමඟ ඇති ගිවිසුම්වල සීමාවන්ද ඉක්මවා ගියේය. අප තරුණ වැඩසටහන් සහ පුහුණු පැවැත්වූ විට, සහභාගිවන්නන්ගේ නම්, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක/පිටපත්, ඔවුන් සහභාගි වූ පාසල් පිළිබඳ තොරතුරු ආදිය ඉල්ලා සිටියහ. අපි එම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළෙමු. ප්‍රශ්න කිරීම් එතැනින් නතර වූයේ නැත. පසුව නිලධාරීන් අපගේ අධ්‍යක්ෂවරුන්ගේ පවුලේ සාමාජිකයන් පිළිබඳ විස්තර සහ ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ද ඉල්ලා සිටියහ.

අපගේ ලියාපදිංචිය සඳහා වූ නිෂ්කාශන වාර්තාව සම්පූර්ණ කිරීමට අවධානය යොමු කළේ එක් පොලිස් ශාඛාවක් පමණක් බව පෙනුණි. අද වන විටත් හමුදා සහ බුද්ධි අංශ නිලධාරීන් අපගේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉල්ලා අප හා සම්බන්ධ වෙති. මෑතකදී විදේශීය රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල නියෝජිතයන් අපගේ ප්‍රදේශයට පැමිණි අවස්ථාවකදී, අප ඔවුන් හමුවන්නේද, සාකච්ඡා කරන්නේ කුමක්ද සහ බෙදාගැනීමට අදහස් කරන තොරතුරු මොනවාදැයි විමසමින් අපට දුරකථන ඇමතුම් ලැබුණි. සමහර අවස්ථාවලදී එවැනි රැස්වීම් පිළිබඳව වාර්තා කරමින් අප තොරතුරු සපයන්නන් (informants) ලෙස කටයුතු කරනු ඇතැයි ඔවුන් අපේක්ෂා කරන බවක් හැඟේ.

7. නිගමනය සහ නිර්දේශ

08 වන නිර්දේශය (Recommendation 8) සම්බන්ධ FATF හි වඩා යෝග්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ (Best Practices) මාර්ගෝපදේශයේ පහත උපුටා දැක්වීම වැදගත් අවබෝධයක් සහ පැහැදිලි කිරීමක් සපයයි.

> "FATF නිර්දේශ ක්‍රියාත්මක කිරීම මගින් ලාභ නොලබන සංවිධාන වෙත අහිතකර සහ අසමානුපාතික බලපෑමක් සිදු නොවන බවටත්, තවද සිවිල් සමාජයේ ක්‍රියාකාරීත්වයට සහ මානුෂීය ආධාර සැපයීමට අනවශ්‍ය ලෙස බාධා නොවන බවටත් තහවුරු කිරීමේ වැදගත්කම FATF සංවිධානය විසින් පිළිගනු ලබයි. මෑත වසරවලදී, මූල්‍ය ආයතන විසින් නීත්‍යානුකූල ලාභ නොලබන සංවිධානවල මූල්‍ය සේවාවන් සඳහා වන ප්‍රවේශය අත්හිටුවීම හෝ සීමා කිරීම, ලාභ නොලබන සංවිධානවල ගනුදෙනු සම්පූර්ණ කිරීමට වැඩි කාලයක් ගැනීම පිළිබඳ වාර්තා වීම් ඉහළ ගොස් ඇත. ලාභ නොලබන සංවිධාන විසින් සිය ප්‍රතිලාභීන් වෙත සේවාවන් සහ සහාය ලබාදීමේ හැකියාවට බාධා පැමිණවීම්, බැංකු ගිණුම් විවෘත කිරීමට නොහැකි වීම සහ අත්තනෝමතික ලෙස බැංකු ගිණුම් වසා දැමීම මෙන්ම, තනි ගනුදෙනුකරුවන්ගේ හෝ සමස්ත ගනුදෙනුකාර පන්තිවල සහ ගනුදෙනුවල සැබෑ අවදානම් මට්ටම හෝ අවදානම් අවම කිරීමේ පියවරයන් සැලකිල්ලට නොගෙන ඒවා සමස්ත ලෙස අත්හිටුවීම ඇතුළුව, ටෙලිග්‍රැෆික් මුදල් හුවමාරුවල ප්‍රමාදයන් සහ නොපැහැදිලි හා නිරන්තරයෙන් ඉහළ යන පාරිභෝගික නිසි පරීක්ෂන (Due Diligence) අවශ්‍යතා පිළිබඳ අවස්ථාවන් ද වාර්තා වී ඇත. මෙය අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක (Risk-based approach) නිසි ක්‍රියාත්මක කිරීමක් නොවන අතර FATF ප්‍රමිතීන්ට අනුකූල ද නොවේ."

FATF මාර්ගෝපදේශ පැහැදිලිව සඳහන් කරන්නේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ක්‍රියාමාර්ග මඟින් නීත්‍යානුකූල ලාභ නොලබන සංවිධාන ක්‍රියාකාරකම්වලට බාධා නොකළ යුතු බවත්, එවැනි බාධාවක් හඳුනාගත් විට එය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු බවත්ය. ලාභ නොලබන සංවිධාන සම්බන්ධයෙන් බැංකුවලට අධික වාර්තාකරණ සහ නිසි පරීක්ෂණ අවශ්‍යතා පැනවීම හේතුවෙන් අධි-අනුකූලතාව (overcompliance) සහ පද්ධතිමය මූල්‍ය බැහැරකිරීම (systemic financial exclusion) සහිත පරිසරයක් නිර්මාණය වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලාභ නොලබන සංවිධාන වලට මූල්‍ය ක්‍රියාකාරකම්වල නිරත වීමට සහ මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමට නොහැකි වී ඇති අතර, බැංකු ශ්‍රී ලංකා මහ බැංකුව/මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද උපදෙස් සහ FATF අවශ්‍යතා ඉක්මවා යමින් කටයුතු කරයි.

මෙය අනපේක්ෂිත ප්‍රතිවිපාක නොවේ. රාජ්‍යයේ නීතිමය ප්‍රතිපත්තිය, එහි ප්‍රසිද්ධ ප්‍රකාශ සහ ලාභ නොලබන සංවිධාන සමඟ පැවති උපදේශනවලදී සිදුකළ වාචික අදහස් දැක්වීම් එක්ව සලකා බැලීමේදී, රාජ්‍ය නොවන සංවිධාන සඳහා සීමාකාරී, දැඩි ලෙස නිරීක්ෂණය කරන සහ පාලනයට ලක් කළ ක්‍රියාකාරී පරිසරයක් හිතාමතාම නිර්මාණය කිරීමට උත්සාහයක් පවතින බව පෙනී යයි. මෙය සුළු ගනුදෙනුවක්, විදේශීය ආධාරක ආයතනයක් හා සම්බන්ධ වීමක් හෝ කිසියම් මානව හිමිකම් සම්බන්ධ ව්‍යාපෘතියක් පවා දැඩි පරීක්ෂාවකට හෝ වාර්තා කිරීමට හේතුවක් විය හැකිය. මෙය බුද්ධි අංශවල සිට ප්‍රාදේශීය බලධාරීන් දක්වා පවතින සෑම පද්ධතියක්ම භාවිත කරමින් රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමටත්, ඒවායේ ක්‍රියාකාරිත්වය රාජ්‍ය අනුමැතිය මත රඳා පවතින තත්ත්වයකට පත් කිරීමටත් රාජ්‍යය විසින් අනුගමනය කරන ක්‍රියාපටිපාටිය සමඟ සමපාත වේ. එබැවින් FATF අවශ්‍යතා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරකම් සීමා කිරීමට රාජ්‍යය විසින් තවත් මෙවලමක් ලෙස භාවිත කරමින් සිටින අතර, එමඟින් FATF ප්‍රමිතීන් අවියක් ලෙස භාවිත කරනු ලබයි.

ඉහත අවධාරණය කළ පරිදි, මහ බැංකුව/මූල්‍ය බුද්ධි ඒකකය විසින් බැංකු සඳහා ක්‍රියාත්මක කරන ලද පුළුල් වාර්තාකරණ අවශ්‍යතා හේතුවෙන් මූල්‍ය සේවා සහ අරමුදල් වෙත ප්‍රවේශය සීමා වීම, රාජ්‍ය නොවන සංවිධාන හට නිදහසේ ක්‍රියාත්මක වීමට නොහැකි තත්ත්වයක් ඇති කර ඇති අතර, එය ඔවුන් සේවය කරන අවදානමට ලක්වූ කණ්ඩායම් සහ ප්‍රජාවන්ට අහිතකර ලෙස බලපා ඇත.

අ. නිර්දේශ

i. ශ්‍රී ලංකා රජය වෙත

රජය විසින්:

- සිවිල් සංවිධාන හට නිදහසේ ක්‍රියාත්මක වීමට සහ සමාගමයේ (සංවිධානය වීමේ) නිදහස භුක්ති විඳීමට හැකි බව සහතික කළ යුතුය.
- 2026 ජූලි මාසයේදී ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ සම්මුතිය පනත, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත වෙත සිදුකරන ලද සංශෝධන අහෝසි කළ යුතුය. එම සංශෝධන මඟින් විධායකයට " විශේෂයෙන් පොලිසියට සහ මූල්‍ය බුද්ධි ඒකකය වෙත " පුළුල් සහ සීමා රහිත බලතල ලබා දෙන අතර, සිවිල් සමාජයේ ක්‍රියාකාරකම් සීමා කිරීමට අවියක් ලෙස භාවිත කළ හැකි පරිපාලනමය වශයෙන් අනවශ්‍ය සහ සංකීර්ණ විධිවිධාන අඩංගු වේ.
- චක්‍රලේඛ අංක 01/2019 අහෝසි කළ යුතු අතර, රාජ්‍ය නොවන සංවිධාන හට ඔවුන්ගේ අරමුදල් වෙත ප්‍රවේශ වීම හෝ බැංකු ගිණුම් විවෘත කිරීම වැළැක්වීමට මූල්‍ය ආයතනවලට බලයක් නොමැති බව පිළිබඳව මූල්‍ය ආයතන දැනුවත් කළ යුතුය.
- චක්‍රලේඛ අංක 01/2025 අහෝසි කළ යුතුය, මන්ද එය ලියාපදිංචි අවශ්‍යතා සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් ඇති කරන අතර රාජ්‍ය නොවන සංවිධාන හට බැංකු ගිණුම් විවෘත කිරීමට නොහැකි තත්ත්වයක් ඇති කරනු ඇත.
- සිවිල් සංවිධාන සමඟ මූල්‍ය බුද්ධි ඒකකය සම්බන්ධ වන විට සාධාරණ ක්‍රියාපටිපාටිය සහ විනිවිදභාවය අනුගමනය කරන බව සහතික කළ යුතුය.
- 2026 ජූලි මාසයේදී සංසරණය කරන ලද රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ නීති කෙටුම්පත ඉවත් කර ගත යුතුය.
- සිවිල් සංවිධාන හි ක්‍රියාකාරිත්වයට සහ ක්‍රියාකාරකම්වලට බලපාන නව නීති සහ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සිවිල් සමාජය අර්ථවත් සහ සියළු දෙනා ඇතුළත් වන ආකාරයෙන් සම්බන්ධ කර ගත යුතු අතර, එම නීති ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂණයන්ට අනුකූල වන බව සහතික කළ යුතුය.
- රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත්වීම ඉවත් කළ යුතුය.

ii. FATF වෙත

- ශ්‍රී ලංකා රජය FATF ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බවත්, ලාභ නොලබන සංවිධානයන්හි ක්‍රියාකාරකම් දුර්වල කිරීමට, සීමා කිරීමට හෝ පාලනය කිරීමට FATF ප්‍රමිතීන් අවියක් ලෙස භාවිත නොකරන බවත් FATF විසින් සහතික කළ යුතුය.



ශ්‍රී ලංකා CSO FATF ජාලය

August 2026